**unit 12**

# ඇමරිකානු ආණ්ඩුක්‍රමය

වාගීශ්වර

- ඇමරිකානු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ
- ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය
- කැබිනට් මණ්ඩලය
- සංඝීය ක්‍රමය
- පක්ෂ ක්‍රමය

sureka wageeshwara

# ඇමරිකානු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

# ඇමරිකානු ආණ්ඩුක්‍රමය හැඳින්වීම (ලක්ෂණ)

"ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වූ කලී චාලක යාන්ත්‍රික යුගයක් කරා ව්‍යාප්ත වූ අශ්ව රථයකි."

-මොන්රෝ-

ඇමරිකානු ආණ්ඩුක්‍රමය 1787 **ෆිඩෙල්ෆියා සම්මුතිය** මගින් සම්මත කොට ගෙන 1789 මාර්තු මස 04 දින සිට ක්‍රියාත්මක වන්නේ ය. ෆිඩෙල්ෆියා සම්මුතියට සහභාගී වූයේ මුල් ජනපද 13 න් ජනපද 12 ක් පමණි. (රෝඩ් දිවයින මීට සම්බන්ධ වූයේ නැත) ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය තුළ **ජේම්ස් මැඩිසන් - ජෝජ් වොෂිංටන් - ඇලක්සැන්ඩර් හැමිල්ටන් - බෙන්ජමින් ප්‍රැන්ක්ලින්** වැනි මහා බුද්ධිමතුන්ගෙන් යුක්ත විය.

1. <u>ලිඛිත ආණ්ඩුක්‍රමයක් වීම.</u>

**N.B** ලිඛිත ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වන්න.

ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රථම ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වේ. මෙය වගන්ති 7 ක් සහ සංශෝධන 27 කින් සමන්විත ඉතා සංක්ෂිප්ත ව්‍යවස්ථාවකි. නෛතික තත්ත්වය තුළ ලිඛිත ආණ්ඩුක්‍රමයක් වුව ද ලිඛිත ව්‍යවස්ථා (නීති) තරම්ම බලවත් සම්ප්‍රධාය මත ක්‍රියාත්මක වන නිර්ලිඛිත කරුණු ද පවතී.

**නිදර්ශන - කැබිනට් ලේකම් මණ්ඩලය.**

2. <u>අනම්‍ය ආණ්ඩුක්‍රමයක් වීම</u>.

**N.B** අනම්‍ය ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වන්න.

ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය ව්‍යවස්ථාවකි. ඉතා දීර්ඝ වූත් වෙහෙසකර වූත් ක්‍රියාවලියක් මගින් එය සංශෝධනය කළ හැකිය. <u>ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා කොංග්‍රස් මණ්ඩලයේ විශේෂ බහුතරයක (2/3) ක අනුමැතිය සහ ප්‍රාන්ත ඒකක (3/4) ක අනුමැතිය අවශ්‍ය වේ</u>. මෙසේ දෘඪ අනම්‍ය පදනමක රඳවා තිබුණ ද වර්තමානය වන විට සංශෝධන 27 ක් ව්‍යවස්ථාවක එක් කොට තිබෙයි.

**නිදර්ශන**

**13 වැනි සංශෝධනය**
(1865 ඇමරිකාවේ වහල් මෙහෙය අවලංගු කිරීම)

**15 වැනි සංශෝධනය**
(1870 සුදු හා සුදු නොවූ ජාතීන්ට සමාන අයිතිවාසිකම් පිරිනැමීම.)

**27 වැනි සංශෝධනය**
(1992 රටේ පුරවැසියන් හා මහජන මන්ත්‍රී මණ්ඩලයේ නියෝජිතයින්ගේ අනුපාතය සම්බන්ධ විධි විධාන)

3. <u>සංධීය ආණ්ඩුක්‍රමයක් වීම.</u>

**N.B** සංධීය ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වන්න.

ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වේ. ආරම්භක අවස්ථාවේ දී එය ජනපද 13 කින් සමන්විත සංයුක්ත රාජ්‍යයක් විය. නමුත් 1789 දී එය සංධීය රාජ්‍යයක් බවට පරිවර්ථනය විය. ආරම්භක අවස්ථාවේ ප්‍රාන්ථ ඒකක 13 ක් පැවති මුත් වර්තමානය තුළ ප්‍රාන්ථ ඒකක **50** ක් දක්වා එය වර්ධනය වී ඇත. මෙම සංධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශක්තිමත් ප්‍රාන්ත රාජ්‍ය නිර්මාණය කර තිබේ. නමුත් ප්‍රායෝගික තලය තුළ දී මධ්‍යම ආණ්ඩුව බලවත්ව පවතී.

4. <u>බලතල බෙදීමේ න්‍යාය භාවිත කිරීම.</u>

**N.B** බලතල බෙදීමේ න්‍යාය යනු කුමක්දැයි හඳුන්වන්න.

චාල්ස් මොන්ටෙස්ක්‍යු විසින් ඉදිරිපත් කරන ලද බලතල බෙදීමේ න්‍යාය ඒ ආකාරයටම ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව භාවිතා කිරීමට උත්සාහ දරා ඇත. නමුත් එය ඒ ආකාරයෙන්ම සාර්ථක වී නොමැත. නමුත් බලතල විභේදන න්‍යාය කිසියම් ප්‍රමාණයකට මේ තුළ ක්‍රියාත්මක වේ.

නිදර්ශන - ව්‍යවස්ථාදායක කටයුතු සඳහා කොංග්‍රස් මණ්ඩලයක් ද , විධායක කටයුතු සඳහා ජනාධිපතිවරයෙක් ද , අධිකරණ කටයුතු සඳහා සුප්‍රීම් උසාවියක් ද නිර්මාණය කර තිබේ. නීති සම්පාදනය, මෙම ආකාරයට නීති ක්‍රියාත්මක කිරීම, නීති විනිශ්චය කිරීම එකිනෙකට වෙනස් ආයතන විසින් සිදු කරයි.

5. <u>සංවරණ තුළන සිද්ධාන්තය මත පදනම් වීම.</u>

**N.B** සංවරණ තුළන සිද්ධාන්තය යනු කුමක්දැයි හඳුන්වන්න.

සංවරණ තුළන සිද්ධාන්තය ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති වැදගත් ලක්ෂණයකි. ව්‍යවස්ථා නිර්මාතෘවරුන් විසින් එක් එක් ආයතන අතර බල තුලනයක් ඇති කිරීම මගින් එක් ආයතනයක ආධිපත්‍යය මතු වීම වැලැක්වීමට උත්සාහ දරා තිබෙයි.

6. <u>ද්විත්ව පුරවැසිභාවය</u>.

සම්භාව්‍යය සන්ධීය ක්‍රමයක් පවතින ඇමරිකාව තුළ පුරවැසියන්ට ද්විත්ව පුරවැසි භාවය හිමිවේ. එනම් සෑම පුරවැසියෙක්ම ඇමරිකානු පුරවැසියෙකු වේ. ඉන්දීය සංධීය ක්‍රමය තුළ ක්‍රියාත්මක වන්නේ ඒකීය පුරවැසි භාවයකි.

7. <u>ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකය.</u>

ඇමරිකානු මධ්‍ය ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික ව්‍යුහයට ස්ථාපනය කර තිබේ. පළමු සභාව මහජන මන්ත්‍රී මණ්ඩලය වේ. දෙවන මණ්ඩලය සෙනෙට් මණ්ඩලය වේ. මෙහි ඇති විශේෂත්වය වන්නේ **පළමු සභාවට වඩා දෙවන සභාව බලවත් ලෙස ස්ථාපනය කර තිබීමයි.**

8. ජනාධිපති ආණ්ඩුක්‍රමයක් වීම.

ඇමරිකානු ආණ්ඩුක්‍රමය ජනාධිපති ආණ්ඩුක්‍රමයකි. විධායක බලතල ක්‍රියාවට නගනු ලබන්නේ පූර්ණ විධායක ජනාධිපති වරයෙකු විසිනි. ජනාධිපතිවරයාට සහාය දීම සඳහා **කැබිනට් ලේකම් මණ්ඩලයක්** ජනාධිපතිවරු විසින් නිර්මාණය කොට ගෙන තිබේ. එය ජනාධිපතිවරයාගේ **පවුල - අන්තේවාසික මණ්ඩලය - මුළුතැන්ගේ අමාත්‍ය මණ්ඩලය** ලෙස ද හඳුන්වයි.

9. සමූහාණ්ඩුවාදය.

ඇමරිකානු එක්සත් ජනපදය ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා ලෙස පෙනී සිටින සමූහාණ්ඩුකි.

10. අධිකරණ විවිරණ බලය.

ඇමරිකානු ව්‍යවස්ථාදායක ආයතනය කොංග්‍රස් සම්පාදනය කළ නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලදැයි පරීක්‍ෂා කිරීමට අධිකරණයට ඇති බලය අධිකරණ විවරණ බලය ලෙස අර්ථකතනය කළ හැකිය. ව්‍යවස්ථාව උල්ලංඝණය වන යම් නීතියක් වේ නම් එය නිශේධ කිරීමට ඇමරිකානු සියළුම පෙඩලේ (සංධීය) උසාවි වලට හැකිය. ඒ සම්බන්ධ පරම බලය භුක්ති විඳිනු ලබන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය. (සුප්‍රීම් උසාවිය.)

11. අයිතිවාසිකම් පනත.

ඇමරිකානු ආණ්ඩුක්‍රමය තුළ ඇති වැදගත් ලක්‍ෂණයක් ලෙස අයිතිවාසිකම් පනත දැක්විය හැකිය. මෙම අයිතිවාසිකම් පනත මුල් අවස්ථාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබුණේ නැත. පසුව එක් කළ සංශෝධනයක් හරහා අයිතිවාසිකම් පනත ව්‍යවස්ථා ගත කරන ලදි.

12. මහජන ස්වාධිපත්‍යය.

රාජ්‍ය බලය උත්පාද වන්නේ ජනතාව විසින්ය යන පිළිගැනීම මහජන ස්වාධිපත්‍ය හෙවත් ජනතා පරමාධිපත්‍ය ලෙස හැඳින්වේ. එය ඇමරිකානු ආණ්ඩුක්‍රමයේ මූලික ලක්‍ෂණයකි.

# ව්‍යවස්ථාදායකය

# ව්‍යවස්ථාදායකය - කොංග්‍රස් මණ්ඩලය

පොදු හැඳින්වීම.

ඇමරිකානු ව්‍යවස්ථාදායක ආයතනය වන්නේ <u>කොංග්‍රස් මණ්ඩලයයි</u>. මෙම කොංග්‍රස් මණ්ඩලය **ද්වි මාණ්ඩලික** ව්‍යවස්ථාදායක ආයතනයකි.

i - **නියෝජිත මන්ත්‍රී මණ්ඩලය**
ii - **සෙනෙට් මණ්ඩලය**

හේතු

- <u>ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් (කොංග්‍රසයක්) පිහිටුවීමට බලපෑ හේතු</u>.

- **ද්වි මාණ්ඩලික ආකෘතිය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයින් දැන සිටීම.**

  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය සඳහා එකතු වූ අභිනියෝජිතයින් ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායක ආයතන සම්බන්ධයෙන් අවබෝධයක් ලබා තිබීම. ඊට හේතු වූයේ ඔවුන් නියෝජනය කළ ජනපද (ප්‍රාන්ථ) වල ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායක සභාවන් පැවතීම. තමන්ගේ මව් රට වූ බ්‍රිතාන්‍යය තුළ ද ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් පැවතීම.

- **ඒකාධිපත්‍යයෙන් ආරක්ෂාවීම.**

  මහජන මන්ත්‍රී මණ්ඩලයේ ඒකාධිපති ස්වභාවය පාලනය කිරීමේ අරමුණින් ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් ස්ථාපනය කිරීමට තීරණය කිරීම.

- **ගතානුගතිකත්වය තහවුරු කිරීම.**

  **පිලඩෙල්පියා සම්මුතියේ** දී ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් ස්ථාපනය කිරීම කෙරෙහි පොදු එකඟතාවයකට එළඹියේ ය. ආණ්ඩුවේ ස්ථාවරත්වය ස්ථාපනය කිරීම එහි අරමුණ විය.

- **සමහරණයක් ඇති කිරීමේ අවශ්‍යතාවය.**

  1776 සිට 1789 දක්වා ඇමරිකාවේ පැවතියේ සංයුක්ත පාලන ක්‍රමයකි. මේ යටතේ පැවති **කොංග්‍රස් මණ්ඩලය ඒක මාණ්ඩලික** විය. ඒ තුළ ජනපද (ප්‍රාන්ත) වලට සමාන නියෝජනයක් ලබා දී තිබුණි. නමුත් විශාල ජනපද ඒම සමාන නියෝජන ක්‍රමයට එකඟ නොවීය. ඔවුන්ගේ අදහස බවට පත්ව තිබුණේ **භූමියේ සහ ජනගහනයේ** ප්‍රමාණයට අනුව කොංග්‍රස් මණ්ඩලයේ නියෝජිතයින් ප්‍රමාණය තීරණය කළ යුතු බවය. කුඩා ජනපද (ප්‍රාන්ත) ප්‍රකාශ කර සිටියේ භූමිය - ජන ග්‍රහනය නොසලකා කොංග්‍රසයට සමාන නියෝජනය යන මූලධර්මය මත සාමාජිකයින් පත්කළ යුතු බවයි.

මෙසේ නියෝජනය සම්බන්ධ ප්‍රතිවිරුද්ධ අදහස් නිසා සම්මුතිය බිඳවැටීමේ අවධානමක් ද දිස් විය. නමුත් **සංගත සමහරණය** යන මාධ්‍ය තුලින් ඊට විසඳුමක් සොයාගතහැකි විය. ඒ අනුව **කොංග්‍රස් මණ්ඩලය ද්වි මාණ්ඩලික ආකෘතියට ස්ථාපනය කොට පළමු සභාව වන මහජන මන්ත්‍රී මණ්ඩලයට ප්‍රාන්ත වල ජන අනුපාතය අනුව නියෝජිතයින් පත් කිරීමට තීරණය කළේය. දෙවන මණ්ඩලය වන සෙනෙට් මණ්ඩලයට ප්‍රාන්ත වලට සමාන නියෝජනයක් ලබා දෙමින් නියෝජිතයින් තෝරා පත්කිරීමට තීරණය කළේය.** මෙම තත්ත්වය නිසා 1789 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ස්ථාපනය කරන විට ද්වි මාණ්ඩලික කොංග්‍රස් මණ්ඩලයක් පිහිටුවීමට ෆිඩෙල්ෆියා සම්මුතියේ අභිනියෝජිතයින් තීරණය කළේය.

මොකක් ද:

## ■ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

කොංග්‍රස් මණ්ඩලයේ පළමු සභාව **නියෝජිත මන්ත්‍රී මණ්ඩලයයි. මහජන මන්ත්‍රී මණ්ඩලය** ලෙස ද මෙය හඳුන්වයි. කොංග්‍රස් මණ්ඩලයේ **පොදු ජන** අංශය මෙය වේ.

සංයුතිය

මෙහි සාමාජික සංඛ්‍යාව 438 කි. **දිස්ත්‍රික්ක පදනම්** කර ගනිමින් **සරල බහුතර නියෝජන ක්‍රමයට** ජනතාව විසින් නියෝජිතයින් තෝරාපත් කරයි.

සුදුසුකම්

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තේරීපත්වීමට අවශ්‍ය සුදුසුකම්, **වසර 7 ක් වත් ඇමරිකාවේ පුරවැසියකු වීම - වයස අවුරුදු 25 සම්පූර්ණ කර තිබීම - ඔහු තේරීපත් වූ ජනපදයේ නිවැසියකු වීම.**

නිලකාලය

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නිලකාලය **වසර 02 කි.** මෙම ධූරකාලය කෙටි නිසාම කොංග්‍රස් සභිකයාට විස්කෘත කාර්ය සාධන වාර්තාවක් දීමට ප්‍රමාණවත් කාලයක් නොලැබේ. මෙම ධූරකාලය දීර්ඝ කල යුතුයැයි යෝජනා පවතී.

වෙනත්

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සභාපතිවරයා කථානායක වරයාය. මහ මැතිවරණයකට පසු ප්‍රථම නියෝජිත මන්ත්‍රී මණ්ඩලය රැස්වීමේදී මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් කතානායකවරයා තෝරාපත් කරයි. ඇමරිකානු කතානායකවරයා එම ධූරය හොබවන්නේ මධ්‍යස්ථව නොවේ. ඔහු තමන්ගේ පක්ෂයට පක්ෂපාතීව කටයුතු කරයි. සරලව දක්වන්නේ නම් බ්‍රිතාන්‍ය කතානායකවරයාගේ ධූරයට හිමි ගෞරවය - කීර්තිය පිළිගැනීම ඇමරිකානු කතානායකවරයාට නොමැත්තේ ය. **නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සන පූර්ණය වන්නේ මන්ත්‍රී මණ්ඩලයෙන් අඩකි.**

● <u>කාර්ය හා බලතල</u>

වෙනත් රාජ්‍යයක පළමු සභාව (බ්‍රිතාන්‍යය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය - ඉන්දියානු ලොක් සභාව) සමග තුලනාත්මකව සන්සන්දනය කිරීමේ දී පැහැදිලිවන පොදු සත්‍යය වන්නේ එම පළමු සභාව සතු කාර්ය හා බලතල වලට වඩා අඩු කාර්ය හා බලතල ප්‍රමාණයක් ඇමරිකානු පළමු සභාව සතු වන බවයි.

(i) <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල.</u>

ව්‍යවස්ථාදායක සභාවක් ලෙස නීති සම්පාදනය කිරීමට බලතල තිබේ. **මුදල් හා සාමාන්‍ය පනත් ආරම්භ කිරීමට බලතල ඇත.** <u>මුදල් පනත් නම් ආරම්භ කළ හැක්කේ මෙම මණ්ඩලයට පමණි</u>. සෙනෙට් සභාව ආරම්භ කළ සාමාන්‍ය පනත් කෙටුම් පතක් **සම්මත කිරීමට - සංශෝධනය කිරීමට - කල් දැමීමට - ප්‍රතික්ෂේප කිරීමට බලය තිබේ.**

(ii) <u>විධායක අංශයේ කාර්ය හා බලතල</u>.

- නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සතුව විධායක බලතල ද පවතී. ඇමරිකානු ජනාධිපති හා උප ජනාධිපතිට එරෙහිව ගෙනෙන දෝශාභියෝග චෝදනාව ආරම්භ කිරීම නමුත් කැබිනට් ක්‍රමයක මෙන් ඍජුව විධායකය පාලනයට බලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නොමැත.
- ජනාධිපති තේරීපත්වීමට අවශ්‍ය බහුතර ඡන්ද ප්‍රමාණය නොමැතිවිට ජනාධිපතිවරයා තෝරාපත් කිරීම.

(iii) <u>මූල්‍යමය බලතල</u>

මුදල් පනත් ආරම්භ කිරීමට බලතල ඇති එකම මණ්ඩලය වීම. බදු සම්බන්ධ පනත්, රාජ්‍ය මූල්‍ය පාලනය.

(iv) **මහජනතාවගේ දුක්ගැනවිලි සොයා බැලීම.**
(v) **අනාගත නායකයින් පුහුණු කිරීම.**
(vi) **යුද්ධය ප්‍රකාශයට පත් කිරීම.** **(N.B මෙය මණ්ඩල දෙකම සතු බලතලයකි.)**

□ <u>කමිටු ක්‍රමය</u>

ඇමරිකානු මහජන මන්ත්‍රී මණ්ඩලය තුළ **කමිටු ක්‍රමයක්** හඳුනාගත හැකිය. නීති සම්පාදනය කිරීමට අදාළ සියුම් කාර්යයන් ඉටු කිරීම මේවායේ වගකීම වේ. ඇමරිකානු ආණ්ඩුක්‍රමය ජනාධිපති ආණ්ඩුක්‍රමයක් නිසා මෙම කමිටු ක්‍රමයට විශේෂ වැදගත් කමක් හිමිව තිබේ.

**නිදර්ශන -**
කෘෂිකර්ම කමිටුව / විසර්ජන කමිටුව / සන්නද්ධ සේවා කමිටුව / බැංකු කටයුතු හා ව්‍යාපාර මුදල් කමිටුව /තැපැල් කටයුතු සහ සිවිල් සේවා කමිටුව / කොළොම්බියා දිසා කමිටුව / අධිකරණය පිළිබඳ කමිටුව / සභා රීති පිළිබඳ කමිටුව / ක්‍රමෝපක්‍රම කමිටුව / අධ්‍යාපන හා කම්කරු කමිටුව / නියෝජිත මන්ත්‍රී මණ්ඩල පරිපාලන කමිටුව

## ■ සෙනෙට් මණ්ඩලය

මොකක් ද

ඇමරිකානු ආණ්ඩුක්‍රමයට අනුව ව්‍යවස්ථාදායක **කොංග්‍රස් මණ්ඩලයේ** දෙවැනි සභාව **සෙනෙට් සභාවයි. උත්තර මන්ත්‍රී මණ්ඩලය** මෙයට අන්වර්ථ නාමයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ I වන වගන්තියේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය යන යෙදුමට පෙර සෙනෙට් යන නම සඳහන් කොට තිබේ. **බ්‍රයිස් සාමිවරයාට අනුව 'උත්තර මන්ත්‍රී මණ්ඩලය වූ කලී ගුරුත්ව කේන්ද්‍රයයි.'** ලැස්කිට **අනුව 'උත්තර මන්ත්‍රී මණ්ඩලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ස්වාමියා ය'. ලින්ඩ්සේ රොජර්ස්** ට අනුව **'නූතන දේශපාලන විද්‍යාවේ විශිෂ්ටතම උත්පාදනය උත්තර මන්ත්‍රී මණ්ඩලය ය වේ'.** ඇමරිකානු සෙනෙට් මණ්ඩලය ලොව ඇති බලවත්ම දෙවෙනි මණ්ඩලය වේ.

සංයුතිය

සෙනෙට් මණ්ඩලයේ සාමාජිකයින් 100 කි. ඇමරිකාවේ ප්‍රාන්ථ 50 කි. **එක් ප්‍රාන්තයකින් නියෝජිතයින් දෙදෙනා (02) බැගින් මෙහි සාමාජිකයින් ජනතාව විසින් තෝරාපත් කරයි.** ප්‍රාන්ත වල භූමිය , ජනගහනත්වය නොලසකා සමාන නියෝජනයක් හිමි කර දීම විශේෂත්වයකි.

| | | | | | |
|---|---|---|---|---|---|
| **නිදර්ශන** -: | නිව්යෝර්ක් | 02 | **නිදර්ශන** -: | ඇරිසෝනා | 02 |
| (විශාල ප්‍රාන්ත) | කැලිෆෝනියා | 02 | (කුඩා ප්‍රාන්ත) | මොන්ටානා | 02 |
| | ටෙක්සාස් | 02 | | රෝඩ් දිවයින | 02 |

සුදුසුකම්

සෙනෙට් සභාවේ සාමාජිකයෙකු ලෙස තේරී පත් වීමට අවශ්‍ය සුදුසුකම්, **වයස අවුරුදු 30 සම්පූර්ණ වීම - අවුරුදු 9 ක හෝ ඊට වැඩි ගණනක පුරවැසි භාවය - තමා අයත් ප්‍රාන්ථයේ නිවැසියෙකු විය යුතු වීම.**

නිලකාලය

සෙනෙට් සභාව එකවර විසිර නොයන ස්ථාවර සභාවකි. වසර දෙකකට වරක් සභාවෙන් 1/3 ක් ඉවත් වන අතර ඒ සඳහා අලුතෙන් 1/3 ක් තේරී පත් වෙයි. **එක් සාමාජිකයෙක් වසර හයක් (6) මෙහි රැඳී සිටී.**

වෙනත්

සෙනෙට් මණ්ඩලයේ සභාපති වරයා වන්නේ **උප ජනාධිපතිවරයා ය.** නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රී වරුන්ට හිමි වන වරප්‍රසාද - වැටුප් සියල්ල සෙනෙට් මණ්ඩලයට ද එම ආකාරයෙන්ම හිමි වේ.

## ● කාර්ය හා බලතල

ඇමරිකානු සෙනෙට් මණ්ඩලය ලොව ඇති ප්‍රබලතම උත්තර මන්ත්‍රී මණ්ඩලය වේ. ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ අංශවල විශාල බලතල ප්‍රමාණයක් එය සතු ය.

01. ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල.

ව්‍යවස්ථාදායක සභාවක් ලෙස නීති සම්පාදනය කිරීමට බලතල ඇත. එය කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකිය.

- මුදල් පනත් කෙටුම්පත්
- මුදල් නොවන පනත් කෙටුම්පත් (සාමාන්‍ය පනත් කෙටුම්පත්)

<u>මුදල් පනත් කෙටුම්පත් ආරම්භ කිරීමට බලතල සෙනෙට් සභාවට නොමැත</u>. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කොට සෙනෙට් සභාවේ අනුමැතිය සඳහා එවන ලද මුදල් පනතක් **සම්මත කිරීමට - සංශෝධනය කිරීමට - කල් දැමීමට - ප්‍රතික්ෂේප කිරීමට** බලතල හිමි වේ.

නිදර්ශන -: **නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සම්මත කළ මුදල් පනතකට සංශෝධන 847 ක් සෙනෙට් මණ්ඩලය සිදු කිරීම.** මින් පැහැදිලි වන්නේ මුදල් පනත් ආරම්භ කිරීමට බලය නොමැති වුවද නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ආරම්භ කළ පනතක් මුළුමනින්ම සංශෝධනය කර නව පනතක් බවට පත් කළ හැක බවයි.

<u>සාමාන්‍ය පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සමාන බලතල සෙනෙට් සභාව සතු ය.</u> සාමාන්‍ය පනත් කෙටුම්පත් ආරම්භ කළ හැකිය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සම්මත කොට සෙනෙට් සභාවේ අනුමැතිය සඳහා එවන ලද පනත් කෙටුම්පතක් **සම්මත කිරීම - සංශෝධනය කිරීම - කල් දැමීම - ප්‍රතික්ෂේප කිරීම** සිදු කළ හැකිය.

**(N.B)** *මෙම මණ්ඩල දෙක තුළ ඒකාගතාවයක් ඇති නොවුන පනත් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගයක් පවතී. එක මණ්ඩලයකින් සාමාජිකයින් , තුන් (03) දෙනෙකු බැගින් සය (06) දෙනෙකුගෙන් යුත් සාකච්ඡා කමිටුවක් පත් කරනු ලබයි. මෙම කමිටුවේ ඒකාගතාවය මත එම පනත සම්මත වීම හෝ ප්‍රතික්ෂේප වීම සිදු වේ. සාමාජිකත්වය අනුව අනුව මෙම කමිටුව තුළ ද සෙනෙට් මණ්ඩලයේ සාමාජිකයන්ගේ අභිමතය නතවුරු වීමේ අවකාශය සහිතය. ඊට හේතු වන්නේ එම සාමාජිකත්වය තුළ ඇති නිපුණ – කාර්යශූර – අද්දැකීම් සහිත භාවයයි.*

02. <u>විධායක අංශයේ කාර්ය හා බලතල.</u>

සෙනෙට් සභාවට විශාල විධායක බලතල ප්‍රමාණයක් සහිතය. මෙම සාහිත්‍යමය ප්‍රකාශනය ඊට අපූරු නිදසුනකි. **උත්තර මන්ත්‍රී මණ්ඩලය ජනාධිපතිවරයා විසින් විධායක බලතල ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඒකාන්තයෙන්ම ව්‍යවස්ථාමය පාලකයකුසේ කටයුතු කරයි.**

- <u>විධායක ජනාධිපතිවරයා විසින් සිදුකරන පත් කිරීම් අනුමත කිරීම.</u> ජනාධිපතිවරයා විසින් කැබිනට් ලේකම්වරු - තානාපතිවරු - පෙඩරල් අධිකරණ වල විනිසුරුවන් - කොන්සල්වරුන් - ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවන් පත්කරනු ලබයි. ඒවා සම්මත වීම සඳහා සෙනෙට් මණ්ඩලය එම පත් කිරීම් අනුමත කළ යුතු ය. අනුමත නොකළ හොත් පත් කිරීම් අවංලගු වන්නේ ය.

- <u>විධායක ජනාධිපතිවරයා එලබෙන විදේශීය ගිවිසුම් ස්ථිර වීම සඳහා සෙනෙට් සභාව (2/3) විශේෂ බහුතරයකින් අනුමත කළ යුතු ය</u>. මෙම ආකාරයට ජනාධිපතිවරයාට විදේශ කටයුතු සම්බන්ධයෙන් **ඒකාධිපති පාලනයක්** ලබාදී නොමැත.

03. <u>අධිකරණ අංශය සතු කාර්ය හා බලතල.</u>

- ජනාධිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වැනි උසස් අධිකරණ ආයතන වලට සිදුකරන පත් කිරීම් සෙනෙට් සභාව විසින් සම්මත කළ යුතු වීම.

- දෝශාභියෝග චෝදනා අධිකරණයක් ලෙස රැස්වී විභාග කිරීම.

ඇමරිකානු ජනාධිපතිවරයාට - උප ජනාධිපතිවරයාට - ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චකරුවන්ට - පෙඩරල් අධිකරණයේ විනිශ්චකරුවන්ට - උසස් රාජ්‍ය නිලධාරීන් ට එරෙහිව එල්ලවන දෝශාභියෝග චෝදනා විභාග කරනු ලබන්නේ සෙනෙට් සභාව විසිනි. රාජ්‍ය ද්‍රෝහී වීම - අල්ලස් හෝ වෙනත් දූෂණ - බරපතල අපරාධ වලට සම්බන්ධ වීම - රාජකාරී කටුයතු වල දී දැඩි අයුතු හැසිරීම - වංචනික ක්‍රියා මත පදනම් වී දෝශාභියෝග චෝදනාවක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ගොනු කළ විට එසේ ගොනු කල වාර්තාව අධිකරණයක් ලෙස රැස් වී විභාග කරනු ලබන්නේ සෙනෙට් මණ්ඩලයයි. එවැනි දෝශාභියෝග චෝදනාවක් සම්බන්ධයෙන් සෙනෙට් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වෙයි. එවැනි වරදකට දෙන දඬුවමකට එරෙහි අභියාචනා කිරීමට හෝ සමාවක් ඉල්ලා සිටීමට හෝ අවසරයක් නොමැත.

මෙම ආකාරයට සෙනෙට් මණ්ඩලය ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ යන ත්‍රිවිධ අංශ සතු බලතල භුක්ති විඳී.

04. <u>යුද්ධය ප්‍රකාශයට පත් කිරීම.</u>

ජනාධිපතිවරයා හමුදාපති වුවද යුද්ධය ප්‍රකාශයට පත් කිරීමට ඔහුට බලය නැත. නමුත් යුද්ධය අවසන් කිරීම ප්‍රකාශයට පත් කිරීමට ජනාධිපතිට හැකිය.

- <u>කමිටු ක්‍රමය</u>

මහජන මන්ත්‍රී මණ්ඩලය තුළ මෙන්ම උත්තර මන්ත්‍රී මණ්ඩලය වන සෙනෙට් මණ්ඩලය තුළ ද කමිටු ක්‍රමයක් පවතී. ස්ථාවර කමිටු 15 ට ආසන්න ප්‍රමාණයක් මෙහි පවතී.

නිදර්ශන -:
කෘෂිකර්ම හා වන විද්‍යා කමිටුව
විසර්ජන කමිටුව
සන්නද්ධ සේවා කමිටුව
සිවිල් සේවා කමිටුව
බැංකු සේවා සහ ව්‍යවහාර මුදල් කමිටුව
මුදල් කමිටුව
කොළොම්බියා දිසා කමිටුව
ප්‍රසිද්ධ වැඩ කමිටුව
පොදු නීති කමිටුව
අධිකරණ පිළිබඳ කමිටුව
විදේශ සම්බන්ධතා කමිටුව
සභා රීති හා පරිපාලන කමිටුව

■ <u>සෙනෙට් මණ්ඩලය තවදුරටත් බලවත් වීමට හේතු</u>

1. **සාමාජිකත්වය කුඩාවීම හා ධූරකාලය දීර්ඝ වීම.**

සෙනෙට් මණ්ඩලයේ සාමාජිකත්වය කුඩා වේ. ධූරකාලය දීර්ග වේ. මහජන මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් 438 කි. නමුත් සෙනෙට් මණ්ඩලයේ 100 කි. එම නිසා වඩාත් කාර්යක්ෂම සුසංගත, සංවෘත්ත මණ්ඩලය බවට පත්ව තිබේ. මහජන මන්ත්‍රී මණ්ඩලය පාලනය කිරීමට අපහසුය. එහි පවත්වන වාද විවාද සෙනෙට් මණ්ඩලයයේ වාද විවාද තරම් උසස් නැත. සෙනෙට් මණ්ඩලයේ මන්ත්‍රීවරු වසර 6 ක ධූරකාලයක් සඳහා පත් කරයි. මෙම තත්ත්වය මත ධූරකාලය සම්බන්ධයෙන් නොවෙහෙසී කටයුතු කිරීමට සෙනෙට් මණ්ඩලයට හැකිය. නමුත් මහජන මන්ත්‍රී මණ්ඩලයේ ධූර කාලය වසර දෙකක් නිසා ඔවුන් නැවත පත්වීමට උත්සාහ කිරීමට වඩා වෙනත් කාර්යයක් නොමැත.

2. **සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය ජ්‍යෙෂ්ඨ දේශපාලඥයින්ගෙන් සමන්විත වීම.**

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය තුළ සාමාජිකයන් බවට පත්වන්නේ හිටපු නියෝජිත මන්ත්‍රීවරු - ආණ්ඩුකාරවරු - තානාපතිවරු - රාජ්‍ය දූතයන් වැන්නන්ය. ඔවුන්ට විශාල දේශපාලන අද්දැකීම් ප්‍රමාණයක් සතු ය.

3. **සෙනෙට් මණ්ඩලය ජනතා ඡන්දයෙන් තෝරාපත් කර ගැනීම.**

සෙනෙට් මණ්ඩලය ද මහජන මන්ත්‍රී මණ්ඩලය මෙන් ඡන්දයෙන් තෝරීපත් වූ මණ්ඩලයකි. සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සමස්ත වශයෙන් ගත් ජනපදයක් (ප්‍රාන්තයක්) නියෝජනය කරයි. මහජන මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයකු නියෝජනය කරනු ලබන්නේ එක්තරා ප්‍රදේශයක් පමණි.

4. **විනිශ්ච සභාවක් ලෙස කටයුතු කිරීම.**

දෝශාභියෝග චෝදනා විභාග කිරීමට හිමි බලය. දෝශාභියෝග චෝදනා සම්බන්ධයෙන් අවසාන අධිකාරී බලය භුක්ති විඳීම.

5. **කැබිනට් පාර්ලිමේන්තු ක්‍රමයක් නොවීම.**

කැබිනට් පාර්ලිමේන්තු ක්‍රමයක විධායක කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවේ පළමු සභාවට වගකිව යුතු ය. එම නිසා දෙවන සභාවට වඩාපළමු සභාව බලවත් වේ. නමුත් ඇමරිකාව ජනාධිපති ආණ්ඩුක්‍රමයකි. එම නිසා කැබිනට් ක්‍රමයක මෙන් පළමු සභාවේ වැදගත් භාවය උලුප්පා දැක්විය නොහැකිය. සැබෑ ලෙසම මෙහි බලවත් වන්නේ සෙනෙට් මණ්ඩලයයි. ජනාධිපතිගේ පත් කිරීම් අනුමත කිරීම - විදේශීය ගිවිසුම් අනුමත කිරීම වැනි හේතු දැක්විය හැකි ය.

6. **විමර්ශන කමිටු පත් කිරීම.**

ආණ්ඩුවේ කටයුතු නිරීක්ෂණය සඳහා විමර්ශන කමිටු පත් කිරීමට සෙනෙට් මණ්ඩලයට හැකිය. විමර්ශ කමිටු වල විමසීම් හඳුන්වනු ලබන්නේ **බිලී බාගැනීමේ චාරිකා** යනුවෙනි. මෙම කමිටුවල ක්‍රියාකාරීත්වය මගින් ආණ්ඩුවේ වැඩකටයුතු විමර්ශනය කරනු ලබයි.

නිදර්ශන -: ට්රූමන් කමිටුව
වෝටර් ගේම් කමිටුව
විදේශ කටයුතු කමිටුව.

"උත්තර මන්ත්‍රී මණ්ඩලය වූ කලී ගුරුත්ව කේන්ද්‍රයයි : එනම්, එක් අතකින් මහජන මන්ත්‍රී මණ්ඩලයේ ප්‍රජාතන්ත්‍රවාදී නොසැලකිලිමත් භාවයත් අනික් අතින් ජනාධිපතිගේ ඒකාධිපති පරමාර්ථයන් සංවරණ කොට නිවැරදි කිරීමේ ආයතනයකි."

-බ්‍රයිස්සාමි වරයා-

- <u>පූර්ණ විධායක ජනාධිපති වරයා ද ඇතුළත් වේ.</u>

ඇමරිකානු ව්‍යවස්ථාදායක කොංග්‍රස් මණ්ඩලයට පූර්ණ විධායක ජනාධිපතිවරයා ද අයත් වේ. ඊට හේතුව වන්නේ කොංග්‍රසය සකස් කරන පනත් කෙටුම්පත් නීති බවට පත් විමට ජනාධිපතිවරයාගේ අවසාන අනුමැතිය අවශ්‍ය වීමයි.

# විධායකය

# ජ නාධිපතිවරයා

හැඳින්වීම.
කවුද

ඇමරිකානු පූර්ණ විධායක ජනාධිපතිවරයා ය. ඔහු රාජ්‍ය නායකයා - ආණ්ඩුවේ නායකයා - විධායකයේ ප්‍රධානියා - සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා වනනේ ය.

□ **ජනාධිපතිවරයා සම්බන්ධයෙන් පලවී ඇති අදහස්.**

> "ඇමරිකානු ජනාධිපතිවරයා ලොව සිටින ප්‍රමුඛතම පාලකයා වන්නේ ය."
> -පොදුමතයකි-
>
> "ඇමරිකානු ජනාධිපතිවරයා ලොව සිටින ශ්‍රේෂ්ඨතම පාලකයා වන්නේ ය."
> -ඕග්-
>
> "ඇමරිකානු ජනාධිපතිවරයා ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙත අනුගමනය කරන කවරකු හෝ භුක්ති විඳින උපරිම බලය භුක්ති විඳී."
> -හෙන්රි මෙන්-

සුදුසුකම්

ඇමරිකාවේ ජනාධිපති ලෙස තේරීපත්වීමට අවශ්‍ය සුදුසුකම් ආණ්ඩුක ව්‍යවස්ථාවේ ලේඛනගත කොට තිබේ.

(i) ඇමරිකා එක්සත් ජනපදයේ උපත ලත් වැසියෙකු විය යුතු ය.
(ii) වයස අවුරුදු 35 ට අඩු නොවිය යුතු ය.
(iii) වසර 14 ක් වත් ඇමරිකාවේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
(iv) දෙවතාවක් ජනාධිපති ධූරය හෙබවූවෙක් නොවිය යුතුය (22 සංශෝධනය)

නිලකාලය

ඇමරිකානු ජනාධිපතිවරයාගේ නිලකාය වසර 04 කි. නමුත් වසර 04 ඉක්මයාමට පෙර ජනාධිපතිවරයා ඉවත් කළ හැකිය. ඒ කොංග්‍රස් සභාව තුළ සම්මත කරන **දෝශාභියෝග චෝදනාවකිනි.**

වේතන
(වැටුප්)

ඇමරිකානු ජනාධිපතිවරයාගේ වාර්ෂික වැටුප 200000 කි. වාර්ෂික වියදම් දීමනාව ඩොලර් 50000 කි. මීට අමතරව වාර්ෂිකව ඩොලර් 10000 ක් බද්දෙන් තොර වූ ගමන් වියදම් දීමනාවක් ලැබෙයි. ජනාධිපතිවරයාට ගෙවනු ලබන පඩි නිලකාලය තුළ අඩු කළ නොහැක්කේ ය. වයිට් හවුස් නම් වූ නිල නිවසක් ඔහුට ලැබෙයි. විශ්‍රාම ගැනීමෙන් පසු වසරකට ඩොලර් 63000 ක විශ්‍රාම වැටුපක් හිමිවේ.

ජනාධිපතිවරු

ඇමරිකාව තුළ ජනාධිපති ධූර හෙබවූ ජනාධිපතිපවරු, ජෝර්ජ් වොෂිංටන් - රූස්වෙල්ට් - අයිසන්හවර් - කෙනඩි - ලින්කන් - බිල් ක්ලින්ටන් - ජොන්සන් - විල්සන් - මොන්රෝ - බුෂ්.

## ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ක්‍රියා පිළිවෙත.

ඇමරිකානු පූර්ණ විධායක ජනාධිපතිවරයා තෝරාගනු ලබන්නේ **ඡන්ද විද්‍යාලයක් - වරණ මණ්ඩලයක් මගිනි.** ඡන්ද විද්‍යාලයට සාමාජිකයින් (ජනාධිපතිවරකයින්) පත් කරනු ලබන්නේ ජනතාව විසිනි. ඒ අනුව ජනාධිපති චක්‍රකාර මහජන ඡන්දයෙන් තෝරාපත් කරයි. ඡන්ද විද්‍යාලයේ ජනාධිපති වරකයින්ගේ **ඒකාන්තර බහුතර ඡන්දයෙන් (50%)** ජනාධිපතිවරයා තෝරාපත් කළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වේ.

- වරණ මණ්ඩලය මගින් ජනාධිපති තෝරා ගැනීමේ ක්‍රියාවලිය අදියර කිහිපයක් ඔස්සේ විග්‍රහ කළ හැකිය.

### ▫ ප්‍රාථමික මැතිවරණ අවස්ථාව.

ඒ ඒ දේශපාලන පක්ෂ විසින් ජනාධිපතිධූර අපේක්ෂකයා තෝරාගැනීම සඳහා සිදු කරනු ලබන ක්‍රියාවලිය ප්‍රාථමික මැතිවරණ අවස්ථාව ලෙස හඳුන්වයි. එක් දේශපාලන පක්ෂයකින් ජනාධිපති ධූර අපේක්ෂකයින් කිහිපදෙනෙක් ඉදිරිපත්ව ඇති විට ඒ අතුරෙන් එක් අපේක්ෂකයෙකු තෝරා ගැනීම මෙහි අරමුණ වේ. මෙම ප්‍රාථමික මැතිවරණය අධියර කිහිපයක් ඔස්සේ සිදු වෙයි. එහි අවසාන අවස්ථාව **ජාතික පක්ෂ සම්මේලනය යි.** ජාතික පක්ෂ සම්මේලනයේදී පක්ෂයෙන් ඉදිරිපත් කරන **ජනාධිපති ධූර අපේක්ෂකයා** හා **උප ජනාධිපති ධූර අපේක්ෂකයා** තීරණය කරනු ලබයි.

### ▫ මැතිවරණ ක්‍රියාවලිය.

ඒ ඒ දේශපාලන පක්ෂ විසින් ජනාධිපතිධූර අපේක්ෂකයා තෝරා ගැනීමෙන් අනතුරුව එම ජනාධිපති ධූර අපේක්ෂකයින් විසින් මැතිවරණ ක්‍රියාවලියේ නිරත වේ. එනම්, තම පක්ෂයෙන් වරණ මණ්ඩල මැතිවරණයට තරග කරන අපේක්ෂකයින් ජයග්‍රහණය කරවන ලෙස ජනාධිපති ධූර අපේක්ෂකයින් මැතිවණ ක්‍රියාවලියේ දී ප්‍රකාශ කර සිටී.

**□ ඡන්ද විද්‍යාලයට (ජනාධිපතිවරකයින්) සාමාජිකයන් නම් කිරීම.**

මැතිවරණ ක්‍රියාලියකින් පසු ඒ ඒ ප්‍රාන්ථ වල දේශපාලන පක්ෂ විසින් ජනාධිපතිවරකයින් නම් කරයි. මෙහි දී පක්ෂ නායකයන්ට - ජ්‍යොෂ්ඨ සාමාජිකයින්ට - ක්‍රියාශීලී සාමාජිකයින්ට මූලිකත්වය ලබා දෙයි. මෙම ජනාධිපති වරකයින් ප්‍රමාණය එම ප්‍රාන්ථය නියෝජනය කරමින් කොංග්‍රස් මණ්ඩලය තුළ සිටින සාමාජික ප්‍රමාණයට සමාන වේ.

**□ ජනාධිපතිවරකයින් (ඡන්ද විද්‍යාලයට සාමාජිකයන්) තෝරා පත් කිරීම.**

ජනාධිපතිවරකයින් තෝරාපත් කර ගැනීම ඒ ඒ ප්‍රාන්ථ විසින් වෙන වෙනම සිදු කරයි. ජනාධිපතිවරකයින් තෝරාපත් කර ගැනීම සඳහා පැවැත්වෙන මැතිවරණයක දී වයස අවුරුදු 18 වැඩි පුරවැසියන්ට ඡන්දය ප්‍රකාශ කළ හැකිය. සැබෑ ලෙසම ජනාධිපතිවරකයින් ට ඡන්දය දෙනු ලබන්නේ එම ජනාධිපතිවරකයින් නියෝජනය කරන ජනාධිපතිධූර අපේක්ෂකයා ගැන සිතාගෙනය.

**□ වරණ මණ්ඩල මැතිවරණය.**

<u>වරණ මණ්ඩල මැතිවරණය අවුරුදු 4 ට වරක් නොවැම්බර් මස පළමු සඳුදාට පසුව එන කුජ (අඟහරුවාදා) දින පවත්වයි.</u>

| |
|---|
| **වරණ මණ්ඩලය -**<br><br>මෙහි සාමාජික සංඛ්‍යාව කොංග්‍රස් මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාවට සමාන වේ. (438 + 100 = 538) කි. නමුත්. මෙය එක් මණ්ඩලයක් ලෙස එක් ස්ථානයකට රැස් නොවිය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වේ. ජනාධිපති ධූරය සඳහා තේරීපත්වීමට වරණ මණ්ඩලයේ ඡන්ද **ඒකාන්තර බහුතරයක් (50%)** ක් ලබා ගත යුතු ය. එනම් ඡන්ද **(269)** ක් ලබා ගත යුතු ය. |

වරණ මණ්ඩලයේ ජනාධිපතිවරකයින් ඔවුන් අයත් ප්‍රාන්තයේ අගනුවරට රැස්ව ජනාධිපති තේරීමේ මැතිවරණයේ දී ඡන්දය ප්‍රකාශ කරති. පසුව ඒවා වොෂිංටන් නගරයට යවනු ලැබේ.

**□ ජනාධිපතිවරයා තෝරා ගැනීම.**

<u>දෙසැම්බර් මාසයේ දෙවන බදාදාට පසුව එන සඳුදා ජනාධිපති වරයා තෝරාගනු ලබයි.</u>

වරණ මණ්ඩලයේ සාමාජිකයින් ඔවුන්ගේ ප්‍රාන්ත වල අගනුවර දී ප්‍රකාශිත ඡන්ද පත්‍රිකා වොෂිංටන් නුවරට රැගෙන ඒමෙන් අනතුරුව **කොංග්‍රස් මණ්ඩලයේ ඒකාබද්ධ රැස්වීමක දී සෙනෙට් සභාවේ සභාපතිවරයා** විසින් ඡන්දය ගණන් කරයි. අනතුරුව ඔහු ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරයි. නමුත් ඔහු ජනාධිපතිවරයා කවුදැයි ප්‍රකාශ කිරීමට පෙර ඇමරිකානු එක්සත් ජනපදයට තේරීපත්වන ජනාධිපතිවරයා කවුදැයි කල් ඇතිවම දනී. ඊට හේතුව වන්නේ වරණ මණ්ඩලයට තේරී පත් වූ සාමාජිකයින් අනුව එය තීරණය කළ හැකි නිසාවෙනි.

- එක් අපේක්ෂකයෙකුවත් ප්‍රකාශිත ඡන්දවලින් (50%) ක් ඒකාන්තර බහුතරයක් ලබාගෙන නොමැති විට, වැඩිම ඡන්ද ලැබූ අපේක්ෂකයන් තිදෙනා තෝරාගෙන ඔවුන් අතරින් කෙනෙක් ජනාධිපතිවරයා ලෙස තෝරාපත් කිරීමට නියෝජිත මන්ත්‍රී මණ්ඩලය බලය තිබේ. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නියෝජනය වන එක් ප්‍රාන්තයකට එක් ඡන්දයක් බැගින් හිමි වේ. එහි දී ඡන්ද 26 ක් ලබාගන්නා අපේක්ෂකයා ජනාධිපතිවරයා ලෙස තේරීපත් වෙයි. මෙම ක්‍රමයට අවස්ථා 3 ක දී ජනාධිපතිවරු තෝරා ගෙන තිබේ.

- උප ජනාධිපතිවරයා තේරීපත් වීමට අදාළ ඡන්ද ප්‍රමාණය දිනාගෙන නොමැති වීමට, ඔහු තෝරාපත් කිරීමේ බලය සෙනෙට් මණ්ඩලය හිමි වේ. එක් මන්ත්‍රීවරයෙකුට එක් ඡන්දයක් ලබා දෙයි. ඡන්ද 51 ක් ලබාගත් අපේක්ෂකයා උප ජනාධිපතිවරයා බවට පත් වේ. **මෙසේ උප ජනාධිපති තෝරාගෙන ඇත්තේ එක් අවස්ථාවන පමණි.**

- **නව ජනාධිපතිධූර ප්‍රාප්තිය.**

  <u>ජනවාරි මස 20 දින ජනාධිපතිවරයා ධූරය වැඩ භාර ගත යුතු ය.</u>

  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂාකරන බවට අග්‍රවිනිශ්චයකාරවරයා ඉදිරියේ දිවුරුම් දී ජනාධිපති ධූරයේ වැඩ බාරගත යුතුය.

## කාර්ය හා බලතල

ඇමරිකානු ජනාධිපතිවරයාට විශාල බලතල ප්‍රමාණයක් හිමිව තිබේ. බලතල බෙදීමේ න්‍යාය පූර්වාදර්ශයකොට ගෙන ඇමරිකානු ආණ්ඩුක්‍රමය නිර්මාණය කළ ද ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ යන ත්‍රිවිධ ආයතන සතුව විශාල කාර්ය හා බලතල ප්‍රමාණයක් භුක්තිවිඳී.

■ <u>ජනාධිපතිවරයාගේ බලතල වල **මූලාශ්‍ර (මූලයන්)** කිහිපයකි.</u>

- <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.</u>

  ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කාර්ය හා බලතල හිමිකර දී තිබේ. එම නිසා එය ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස හඳුනාගත හැකිය.

- <u>කොංග්‍රස් සභාවේ අණ පනත්</u>

  ජනාධිපතිවරයාගේ බලතල වලට අදාළ තවත් ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස කොංග්‍රස් සභාවේ අණ පනත් දැක්විය හැකිය. අපමණ වූ අභිමතානුසාරී බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය ජනාධිපතිවරයා වෙත පැවරීමට කොංග්‍රස් මණ්ඩලයට හැකිය.

නිදර්ශන -: න්‍යෂ්ටික අවි ආයුධ භාවිතා කළ යුත්තේ කෙසේ ද යන්න තීරණය කිරීමේ බලතල පැවරෙන යෝජනාව.

1933 දී ඩොලරයේ අඩංගු විය යුතු රත්තරං අනුපාතය තීරණය කිරීමේ බලතල කොංග්‍රස් මණ්ඩලය ජනාධිපතිවරයාට පැවරීම.

1941 - (Lend - Lease Act) මෙමගින් ජර්මනිය සමග යුධ වැද සිටින රටවල් වලට ජනාධිපතිගේ අභිමතය පරිදි ආධාර සැපයීම තීරණය කිරීමේ බලය ජනාධිපතිට පැවරීම.

1964 Golf of Tonkin යෝජනාව - අග්නිදිග ආසියාවේ ඇමරිකානුවන් ආරක්ෂා කිරීමේ බලය ජනාධිපතිට පවරන ලදි.

- <u>ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයාගේ බලතල අපැහැදිලි වූ සෑම විටම ශ්‍රේෂ්ඨාධිකරණය ඔහුගේ බලය වැඩි කළේ ය.

නිදර්ශන -: meyers - නඩු තීන්දුව.

සංධීය (ෆෙඩරල්) නිලතල වලට උසස් රාජ්‍ය නිලධාරීන් පත් කළ යුතු ආකාරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා තිබුණ ද ඔවුන් ඉවත් කරන ආකාරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සටහන් කර නොමැත. එම තත්ත්වය මත ශ්‍රේෂ්ඨාධිකරණය (1867) විසින් ඔවුන් ඉවත් කිරීමේ බලය ජනාධිපති වරයාට ලබා දුන්නේ ය.

යුද්ධ ප්‍රකාශ කරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කොංග්‍රස් මණ්ඩලයට පවැරුව ද යුද්ධය අවසන් කිරීමේ බලය කොංග්‍රසයට පවරා නැත. එම නිසා **යුද්ධය නිම කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනාධිති වෙත ලබා දුන්නේ ය.**

- <u>සම්ප්‍රදාය හා ව්‍යවහාරයන්.</u>

සම්ප්‍රදායන් හා ව්‍යවහාරයන් ජනාධිපතිවරයාගේ බලතල වලට අදාළ ශක්තිමත් මූලාශ්‍රයකි.

නිදර්ශන -: ජනාධිපතිවරයාගේ පත් කිරීම් සම්බන්ධ බලතල ක්‍රියාවට නැංවිය යුත්තේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ අනුමැතිය සමගිනි. උත්තර මන්ත්‍රී මණ්ඩලය **ආචාර ශීලීත්වය පිළිබඳ සම්ප්‍රදායෙන්** ජනාධිපතිවරයාගේ පත් කිරීම් වලට සාමාන්‍යයෙන් විරුද්ධ නොවෙයි.

- <u>හදිසි අවස්ථා.</u>

හදිස් අවස්ථා ද ජනාධිපතිවරයාගේ බලතල අධික ලෙස වර්ධනය කරන මූලාශ්‍රයක් ලෙස හඳුනාගත හැකිය.

නිදර්ශන -: ලෝක මහා සංග්‍රාමික අවධි තුළ ජනාධිපතිවරයා ආඥාධායක අන්දමින් ක්‍රියා කිරීම.

▫ <u>ජනාධිපතිවරයා සතු බලතල.</u>

ඇමරිකානු ජනාධිපතිවරයා ලෝකය අධිකතර බලතල භුක්ති විඳින රාජ්‍ය නායකයා ලෙස හඳුනාගත හැකිය. ඇමරිකානු ආණ්ඩුක්‍රමය බලතල බෙදීමේ න්‍යාය පූර්වාදර්ශය කොටගෙන නිර්මාණය කළ ද ජනාධිපතිවරයා පහත අංශ සතු බලතල භුක්ති විඳී.

- ව්‍යවස්ථාදායක බලතල
- විධායක බලතල
- අධිකරණ බලතල
- මූල්‍ය බලතල

● <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

(i) **පනත් කෙටුම්පත් වලට අවසාන අනුමැතිය ලබා දීම.**

කොංග්‍රස් මණ්ඩලය සකස් කරන පනත් කෙටුම්පතක් නීතියක් බවට පත් වීමට ජනාධිපතිවරයාගේ අනුමැතිය අවශ්‍ය වේ. ඒ අනුව ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල සතුය. <u>ජනාධිපතිවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ පනත් කෙටුම් පතක් සම්බන්ධයෙන් ගත හැකි පියවරයන් කිහිපයකි.</u>

- **පනත් කෙටුම්පතට අනුමැතිය දී එය නීතියක් බවට පත් කිරීම.**
- **පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කර සංශෝධය සහිතව හෝ රහිතව කොංග්‍රස් මණ්ඩලයට ආපසු යැවීම.**

මෙසේ ආපසු එවූ පනතක් කොංග්‍රස් මණ්ඩලයේ **මහජන මන්ත්‍රී මණ්ඩලය** හා **සෙනෙට් මණ්ඩලය** වෙන වෙනම 2/3 ක **විශේෂ බහුතරයකින්** සම්මත කළ හොත් ජනාධිපතිට නැවත එම පනතට අනුමැතිය නොදී සිටිය නොහැකිය.

- **රුඳවුම් පොකට් නිශේධ බලය ක්‍රියාවට නැංවීම.**

ජනාධිපතිවරයා වෙත එවන ලද පනත් කෙටුම්පතට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන තමා වෙත රඳවා තබා ගත හැකිය. මෙවැනි අවස්ථාවක කොංග්‍රස් සභාවේ සභාවාර අවසන් වී නොමැති නම් **ඉරිදා හැර දින 10** ක් ගත වූ පසු ජනාධපතිගේ අනුමැතිය නොමැතිව එම පනත නීතියක් බවට පත් කිරීමට කොංග්‍රස් මණ්ඩලයට හැකිය. නමුත් මෙවැනි රදවා ගැනීමක දී දින 10 ඉක්මයාමට පෙර කොංග්‍රස් මණ්ඩලයේ සභාවාර විසුරුවා හළ හොත් උක්ත කෙටුම්පත අහෝසි වී යයි. එය රුඳවුම් පොකට් නිශේධ බලය වේ.

(ii) **කොංග්‍රස් මණ්ඩලයට පණිඩුව යැවීම.**

ජනාධිපතිවරයාට කොංග්‍රස් මණ්ඩලයට පණිවුඩ යැවිය හැකිය. එම පණිවුඩ **වාචිකව හෝ ලිඛිතව** යැවිය හැකිය. රාජ්‍ය නායකයා වශයෙන් ජනාධිපතිවරයාගේ පණිවුඩ නොසලකා හැරීමට කොංග්‍රස් මණ්ඩලයට නොහැකි ය. කොංග්‍රසය ආරම්භ කරන බොහෝ පනත් වලට ජනාධිපති වරයා විසින් එවන ලද පණිවුඩ මූලාශ්‍ර වී තිබේ.

නිදර්ශන -: ජනාධිපති මොන්රෝ විසින් ඉදිරිපත් කරන ලද **සුප්‍රකට මොන්රෝ ප්‍රතිපත්තිය** කොංග්‍රස් මණ්ඩලයට එවනු ලබන්නේ පණිවුඩයක ආකාරයෙනි.

(iii) **නීති සකස්කර ගැනීම.**

ජනාධිපතිවරයා කොංග්‍රස් මණ්ඩලය ලවා තමාට අවශ්‍ය නීති සකස් කරවා ගනී. බලතල බෙදනු ලැබූ ආණ්ඩුක්‍රමයක් නිසා සෘජුව කොංග්‍රස් මණ්ඩලයට බලපෑම් කරමින් නීති සකස් කර ගැනීමට ජනාධිපතිවරයාට නොහැකිය. නමුත් ඒ සඳහා වක්‍ර උපාය මාර්ග භාවිත කරයි. ඒවා නම් ,

- **පෞද්ගලික මට්ටමින් ඉල්ලීම් කිරීම.**

  මන්ත්‍රීවරු පෞද්ගලිකව මුණ ගැසී එකඟතා ගොඩ නගා ගැනීම මගින් තමන්ට අවශ්‍ය නීති සම්පාදනය කර දෙන මෙන් ඉල්ලීම.

- **ජනතාව හරහා බලපෑම් කිරීම.**

  ජනමාධ්‍ය මගින් ජනතාව ආමන්ත්‍රණය කරමින් ජනාධිපතිවරයා යම් පනතක වැදගත්භාවය ප්‍රකාශ කරයි. එවිට ජනතාව එම පනත සම්බන්ධයෙන් ප්‍රසාදයක් දක්වන බව කොංග්‍රසයට හැඟී යයි නම් කොංග්‍රස් මණ්ඩලය එම නීතිය සම්පාදනය කරයි.

- **කොංග්‍රස් මණ්ඩලයට පණිවුඩ යැවීම.**

  ජනාධිපතිවරු කොංග්‍රසයට පණිවිඩ යැවීම මගින් නීති වලට අදාළ මූලාරම්භයක් ලබාදේ. නිදසුන් ලෙස ජනාධිපති **අයිසන්හවර්** පණිවිඩ මගින් **විශේෂිත ව්‍යවස්ථා සම්පාදන ඉල්ලීම් 225 ක්** තරම් විශාල ප්‍රමාණයක් කොංග්‍රසයට ඉදිරිපත් කිරීම.

(iv) **කොංග්‍රස් මණ්ඩලයේ විශේෂ සැසිවාර කැඳවීම.**

ජනාධිපතිවරයාට කොංග්‍රස් මණ්ඩලය විසුරුවා හැරීමේ බලය නොමැත. නමුත් විශේෂ සභාවාර කැඳවීමට අයිතිය තිබේ.

**නිදර්ශන -:** 1913 දී **ජනාධිපති විල්සන්** විසින් සියලුම වැදගත් නීති සකස් කර ගැනීමට කොංග්‍රස් මණ්ඩලයේ විශේෂ සභාවාර කැඳවීම.

(v) **නීතිමෙන් වලංගු විය හැකි අතිරේක ව්‍යවස්ථා පැනවීම.**
(අභියෝජිත නීති සම්පාදනය/ රීති සම්පාදන බලය)

ජනාධිපතිවරයාට ස්වකීය විධායක බලය ක්‍රියාත්මක කරමින් නීතිමෙන් වලංගු වන අතිරේක ව්‍යවස්ථා පැනවිය හැකිය.

**නිදර්ශන -:** 1944 වර්ෂය තුළ කොංග්‍රස් මණ්ඩලය 4553 ක් සකස් කරන විට ජනාධිපති රූස්වෙල්ට් මෙම ක්‍රමයට නීති 3703 ක් පමණ සකස් කර තිබුණි.

(vi) **අවිධිමත් සම්මේලන.**

කොංග්‍රස් මණ්ඩලයේ සාමාජිකයින් අවිධිමත් පදනම තුළ රාශිගත කරණයට ජනාධිපතිවරයාට හැකිය. **රාත්‍රී භෝජන සංග්‍රහ පැවැත්වීම - සාද පැවැත්වීම** මෙවැනි රැස්වම් අවිධිමත් සම්මේලන ලෙස හඳුන්වයි. ජනාධිපතිවරයාගේ පක්ෂයේ බහුතර බලය සහිත කොංග්‍රස් මණ්ඩලයක් වේ නම් ජනාධිපතිට අවිධිමත් සම්මේලන කැඳවීම ඉතා පහසුය. මෙම අවධිමත් සම්මේලන මගින් ව්‍යවස්ථාදායක

කාර්යයන්ට ජනාධිපති වරයා වක්‍රාකාරයෙන් සම්බන්ධ වේ. මෙසේ කොංග්‍රස් සභාවේ මනෝභාවයන් හඳුනාගත් ප්‍රවීන විධායකයකු මෙම අවිධිමත් සම්මේලන මගින් වැදගත් ප්‍රශ්න බොහෝමයක් නිරාකරණය කර ගනී.

(vii) **සමූහාණ්ඩු මතය ඇති කරන ලෙස අයාචනා කිරීම.**

කොංග්‍රස් සභාව ජනාධිපතිවරයාට විරුද්ධව නැගී සිටින වීට ඔහුට ජනතාව වෙත කෙලින්ම අභියාචනා කළ හැකිය. එසේ අභියාචනා කරමින් කොංග්‍රස් සභාවේ සිටින ප්‍රතිවාදීන්ට විරුද්ධව ජනමතයක් නිර්මාණය කළ හැකිය. කොංග්‍රස් මණ්ඩලය නිවැරදි දිශානතියට යොමු කිරීමට ජනාධිපතිවරු විසින් මෙම ක්‍රමය ඵලදායි ලෙස යොදාගත් අවස්ථා තිබේ. පුවත්පත් - සගරා - රූපවාහිනිය - ගුවන් විදලිය ආදී මාධ්‍යයක් ඒ සඳහා භාවිතා කරයි.

නිදර්ශන -: **රූස්වෙල්ට් ජනාධිපතිවරයා** දේශන මට්ටමින් ගුවන් විදුලි ජාලය ඔස්සේ සුහද සල්ලාප මාලාවක් ආරම්භ කිරීම.

**කෙනඩි ජනාධිපතිවරයා** රූපවාහිනිය මගින් ජනතාවගේ සහාය පැතීම.

- <u>විධායක අංශයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

ඇමරිකානු ජනාධිපතිවරයාට විශාල විධායක බලතල ප්‍රමාණයක් හිමි වේ. එය පහත පරිදි කණ්ඩනය කරමින් විග්‍රහ කළ හැකියි.

- ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් ජනාධිපති සතු බලතල.

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්‍ෂා කිරීම.

(ii) ඇමරිකාව තුළ ෆෙඩරල් නීතිය ක්‍රියාවට නැගීම.

(iii) ප්‍රාන්ථ රාජ්‍යයන්හි සමූහාණ්ඩුක්‍රමය ආරක්‍ෂා කොට ගෙන පවත්වා ගෙන යාම.

(iv) ඇමරිකා එක්සත් ජනපදය හෝ ප්‍රාන්ථ රාජ්‍යයන් විදේශීය ආක්‍රමණයන්ගෙන් හෝ අභ්‍යන්තර කැරලිකෝලාහල වලින් ආරක්‍ෂා කොට ගෙන පවත්වා ගෙන යාම.

(v) ඇමරිකාව එළඹෙන විදේශීය ගිවිසුම් ක්‍රියාවට නැගීම.

(vi) රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම.

(vii) අයවැය පාලනය කිරීම.

- <u>හමුදාපති වශයෙන් ජනාධිපතිවයා සතු බලතල.</u>
  (සන්නද්ද සේවාවන්හි ප්‍රධාන අණ දෙන නිලධාරියා ලෙස ජනාධිපති සතු බලතල)

(i) ඇමරිකානු එක්සත් ජනපදයේ ජාතික ආරක්‍ෂාව තහවුරු කොට පවත්වාගෙන යාම.

(ii) **සෙනෙට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව ත්‍රිවිධ හමුදාපතිවරු පත්කිරීම. ස්වකීය අභිමතයට අනුව ඉවත් කිරීම.**

(iii) **කොංග්‍රස් මණ්ඩලයේ අනුමැතියට යටත්ව යුද්ධය ප්‍රකාශ කිරීම.**
නමුත් ඇතැම් ජනාධිපතිවරු කොංග්‍රස් මණ්ඩලය ඉක්මවා යමින් යුද්ධය ප්‍රකාශ කළ අවස්ථා ඇමරිකානු ඉතිහාසය තුළ විද්‍යාමාන වේ.

නිදර්ශන -: ට්‍රූමන් ජනාධිපතිවරයා කොරියාවට විරුද්ධව පොලිස් ක්‍රියාමාර්ග ගැනීම.

(iv) **ස්වකීය අභිමතයට අනුව සාමය ප්‍රකාශ කිරීම.**

(v) **ඇමරිකා එක්සත් ජනපදයේ හමුදාව ස්ථාන ගත කළ යුතු ආකාරය සැලසුම් කිරීම.**

(vi) **යුධ නෞකා - ගුවන් යානා ස්ථානගත කළ යුතු ස්ථාන තීරණය කිරීම.**

- <u>විදේශ කටයුතු පරිපාලනය කිරීම.</u> (විදේශ සම්බන්ධතා ප්‍රකාශක)

(i) **විදේශයන්හි ඇමරිකා එක්සත් ජනපදය නියෝජනය කිරීම.**

(ii) **සෙනෙට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව තානාපතිවරු හා විදේශීය දූතයන් පත් කිරීම.**

(iii) **විදේශීය තානාපතිවරු හා දූතයන් පිළිගැනීම.**

(iv) **විදේශීය ගිවිසුම්වලට එළඹීම.**
ජනාධිපති එළඹෙන විදේශීය ගිවිසුම් සෙනෙට් මණ්ඩලය (2/3) ක විශේෂ බහුතරයකින් සම්මත කළ යුතු ය. එසේ සම්මත නොකරන ගිවිසුම් අවලංගු වේ.

නිදර්ශන -: 1919 දී ජාතීන්ගේ සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමට ජනාධිපති විල්සන් දැරූ ප්‍රයත්නය සෙනෙට් මණ්ඩලය විසින් ව්‍යර්ථ කිරීම.

(v) **රජයේ රාජ්‍ය උපාය මාර්ග ක්‍රියාවට නැගීම.**

(vi) **විදේශ ප්‍රතිපත්ති සකස් කිරීම.**

(vii) **අලුතින් බිහි වූ විදේශයන් (රාජ්‍යයන්) පිළිගැනීම.**

- <u>පත් කිරීම් සම්බන්ධ බලතල.</u>

(i) **සෙනට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව සිදු කරන ජ්‍යෝෂ්ඨ විධායක පත් කිරීම්.**

කැබිනට් ලේකම්වරුන් - තානාපතිවරුන් - අමාත්‍යාංශ ප්‍රධානීන් ආදීව විශේෂ වැදගත් පත් කිරීම් 1600 ට ආසන්න ප්‍රමාණයක් ජනාධිපතිවරයා විසින් සිදු කරයි. මෙම පත්කිරීම් සෙනෙට් සභාව අනුමත කළ යුතු ය. අනුමත නොකළ විට පත්කිරීම් අවංගු වේ.

නිදර්ශන -: **බිල් ක්ලින්ටන්** ජනාධිපතිවරයා කැබිනට් ලේකම් මණ්ඩලයට **නීති ලේකම්** ලෙස නම් කළ **සෝබෙයාඩ්** මහත්මිය සෙනෙට් මණ්ඩලය විසින් අනුමත නොකිරීම. පසුව නීති ලේකම් ලෙස **ජෙනට් රේනෝ** මහත්මිය පත් කිරීමට ජනාධිපතිවරයාට සිදුවිය.

**1989** වර්ෂයේ දී **බුෂ්** ජනාධිපතිවරයා විසින් ආරක්ෂක ලේකම් ලෙස **ටවර්** පත් කිරීම ප්‍රතික්ෂේප කිරීම.

- <u>රාජ්‍යය නායකයා ලෙස තනිව ක්‍රියාත්මක කරන බලතල.</u>

(i) **ජාතික නත්තල් ගස දැල්වීම.**
(ii) **ජාතික වීරයින්ට පදක්කම් පිරිනැමීම.**
(iii) **රාජ්‍ය තුළ සහ විදේශයන්හි වැදගත් පුද්ගලයින් මුණ ගැසීම.**
(iv) **ජාතික වශයෙන් වැදගත් රාජ්‍ය පණිවුඩ නිකුත් කිරීම.**
(v) **ඇමරිකානු එක්සත් ජනපදය සතු දේපළ ආරක්ෂා කිරීම.**
(vi) **නම්බුනාම ප්‍රදානය කිරීම.**
(vii) **නිල කටයුතු සම්බන්ධයෙන් නඩු පැවරීමෙන් නිදහස් වීම.**
(viii) **ජාතික උත්සව වල මුලසුන දැරීම.**

- <u>**ඉවත් කිරීම් සම්බන්ධ බලතල.**</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දෝශාභියෝග චෝදනාවකින් ඉවත් කළ යුතු යැයි දක්වා නොමැති සෙසු නිලධාරීන් ජනාධිපතිවරයාට ස්වකීය අභිමතය පරිදි ඉවත් කිරීමට හැකිය. මෙම බලය 1867 දී ශ්‍රේෂ්ඨාධිකරණ පනතකින් ජනාධිපතිවරු සතු කල කාර්ය හා බලතලයකි.

## <u>අධිකරණ අංශයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

(i) **උසස් අධිකරණ ආයතන වලට විනිශ්චකාරවරු පත් කිරීම.**

මෙම පත් කිරීම් සෙනෙට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව සිදු කිරීම ජනාධිපතිවරයා බැඳී සිටී.

(ii) **අග්‍රවිනිශ්චකාරවරයා සෙනෙට් සභාවේ අනුමැතියට යටත්ව පත් කිරීම.**

(iii) **උසස් අධිකරණ ආයතනවල විනිශ්චකාරවරු ඉවත් කිරීම.**

මෙම ඉවත් කිරීම් සඳහා කොංග්‍රස් මණ්ඩලය විසින් එම විනිශ්චකාරවරුන්ට එරෙහිව දෝශාභියෝග චෝදනාවක් සම්මත කර තිබිය යුතු ය.

(iv) **වරදකරුවන්ට සමාව දීම - දඬුවම් කල්දැමීම - දඬුවම් සංශෝධනය.**

නමුත් දෝශාභියෝග චෝදනාවක් මගින් වරදකරුවන් බවට පත් කළ පුද්ගලයන්ට සමාව දීමට හෝ දඬුවම් සංශෝධනය කිරීමට ජනාධිපතිවරයාට නොහැක්කේ ය.

- <u>මූල්‍ය හා සම්බන්ධ කාර්ය හා බලතල (භූමිකාව)</u>

මූල්‍ය බලතල කොංග්‍රස් මණ්ඩලය වෙත පවරා තිබුණ ද නියම වශයෙන් මූල මෙහෙයවීම හා පාලනය සිදු කරනු ලබන්නේ ජනාධිපතිවරු විසිනි. ඊට අදාළව.

(i) **අයවැය ලේඛනය ජනාධිපතිවරයාගේ සෘජු අධීක්ෂණ යටතේ සකස් කළ යුතු වීම.**

(ii) **ජනාධිපතිවරයා මූල්‍ය කටයුතු හසුරුවන පොදු කළමනා කරු ලෙස හැඳින්වීම.**

මෙම ආකාරයට බලතල බෙදීමේ මූලධර්මය මත නිර්මාණය කළ ආණ්ඩුක්‍රම වුව ද ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ - මූල්‍ය යන අංශ සතු විශාල බලතල හා කාර්යන් ප්‍රමාණයක් ජනාධිපතිවරයා සතුය.

- **ඇමරිකානු ජනාධිපතිවරයාගේ උපයෝගීතාවය (තත්ත්වය)**

ඇමරිකානු ජනාධිපතිවරයාගේ තත්ත්වය සම්බන්ධයෙන් දේශපාලන විචාරකයින් දක්වා ඇති අදහස් කිහිපයක් පමණක් තැබීම වැදගත් වේ.

"ඇමරිකානු ජනාධිපතිවරයා පාලනය කරයි. එහෙත් රජකම් නොකරයි. ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නිර්මාතෘවරු බ්‍රිතාන්‍යය රජුගේ සියළු බලතල ගෙන ඒවා ජනාධිපතිවරයාට පැවරූහ. ඔවුන් ඒවා සීමා කලේ සීමාව ඉක්මවා ගිය සේ පෙනී ගිය අවස්ථාවන්හි දී පමණි."

-සර් හෙන්රි මෙන්-

"මුළු මහත් ජාතියම ජනාධිපති තෝරාපත් කර ගෙන තිබේ. රටතුළ සිදුවන සියළු කටයුතු සම්බන්ධයෙන් තීරණ ගන්නේ ඔහුය. ඔහුට වරක් ජාතියේ ප්‍රසාදය හා විශ්වාසය දිනාගැනීමට දුන් කළ අන් කිසිදු බලවේගයකට ඔහු මැඩලිය නොහැකි වන අතර එබඳු බලවේග කිහිපයක් එකතු වීමෙන් ද ඔහු පහසුවෙන් පැරදවිය නොහැකි ය."

-ජානාධිපති විල්සන්-

තවදුරටත් ඇමරිකානු ජනාධිපතිවරයාගේ තත්ත්වය පරීක්ෂාව සඳහා බ්‍රිතාන්‍යය රැජින - අගමැති ඉන්දියානු ජනාධිපති සමග තුලනාත්මක සංසන්දනය කිරීම මගින් හැකිය. විටෙක රජෙකු ඉක්මවා ගිය බලතල භුක්ති විඳී විටෙක රජෙකුට වඩා අඩු බලතල ඇමරිකා ජනාධිපති භුක්ති විඳී.

## ජනාධිපතිවරයා ධූරයෙන් ඉවත් කරන ආකාරය.

ජනාධිපතිවරයාගේ ධූරකාලය (නිලකාලය) වසර 04 කි. මෙම නිලකාලය ඉක්ම යාමට පූර්වයේ ජනාධිපතිවරයා ඉවත් කළ හැකිය. ඒ දෝෂාභියෝග චෝදනාවක් කොංග්‍රස් මණ්ඩලය තුළ සම්මත කිරීමෙනි.

● <u>ජනාධිපතිවරයාට එරෙහිව දෝශාභියෝග චෝදනා ගොනු කිරීමට හැකි අවස්ථා</u>

- **රාජ්‍ය ද්‍රෝහී ලෙස කටයුතු කිරීම.** - **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම.**
- **අල්ලස් හෝ වෙනත් දූෂණ.** - **චරිත දූෂණය.**
- **කායික හෝ මානසික විකෘතිතාවය.** - **බරපතල අපරාධවලට සම්බන්ධ වීම.**

මෙම කවර හෝ හේතුවක් මත කොංග්‍රස් මණ්ඩලයේ නියෝජිත **මන්ත්‍රී මණ්ඩලයට** දෝශාභියෝග චෝදනාවට අදාළ වර්තාව (වගන්ති) ගොනු කළ හැකිය. ජනාධිපතිවරයාට විරුද්ධව එන දෝශාභියෝග චෝදනාව අධිකරණයක් ලෙස රැස්වී විනිශ්චය කරනු ලබන්නේ **සෙනෙට් මණ්ඩලය** විසිනි. මෙවැනි විටෙක සෙනෙට් මණ්ඩලයේ මුල සුන දරනු ලබන්නේ උපජනාධිපතිවරයා නොව **අග්‍රවිනිශ්චකාරවරයා** ය. මෙවැනි රැස්වීමක දී නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ජනාධිපතිට විරුද්ධව ඉදිරිපත් කළ **දෝශාභියෝග චෝදනා පත්‍රය උත්තර මන්ත්‍රී මණ්ඩලය (සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය) 2/3 ක විශේෂ බහුතරයකින් සම්මත කළ හොත් ජනාධිපතිවරයා ජනාධිපති ධූරයෙන් ඉවත් විය යුතු ය.**

● <u>දෝශාභියෝග චෝදනාවකින් වරදකරු වුවහොත් ලබාදිය හැකි දඩුවම්</u>

- ජනාධිපති ධූරයෙන් ඉවත් කිරීම.
- රජයේ වගකීම් සහගත රැකියා තනතුරු ලබා නොදීම මේ හැර වෙනත් දඬුවමක් ලබා දීමට නොහැකි ය.

● <u>දෝශාභියෝග සඳහා ඉදිරිපත් වූ අවස්ථාවන්ට නිදර්ශන.</u>

- 1868 දී ජනාධිපති **ජොන්සන්ට.**

- **නික්සන්** ජනාධිපතිවරයා ඉල්ලා අස්වීම භාර නොදුන්නේ නම් ඔහුට ද දෝශාභියෝග චෝදනාවක් එල්ලවීමට අවකාශය තිබුණි.

- **බිල් ක්ලින්ටන්** ජනාධිපතිවරයාට.

නමුත් මෙම කිසිදු දෝශාභියෝග චෝදනාවක් සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය තුළ සම්මත වූයේ නැත.

## අනුප්‍රාප්තිය.

ජනාධිපතිවරයා ඉවත්වීම හෝ මිය යාම හේතු කොට ගෙන අනුප්‍රාප්තික ජනාධිපතිවරයා ලෙස කටයුතු කිරීම **උප ජනාධිපතිවරයාට** පැවරෙයි. උප ජනාධිපති වරයා ද ඉවත් කිරීම හෝ මිය ගිය අවස්ථාවක ජනාධිපති ධූරයේ වැඩ බැලීම කවුරුන් විසින් සිදු කළ යුතු දැයි මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා තිබුණේ නැත. 1947 පනතකින් සම්මත කළ ආකාරයට උප ජනාධිපතිට පසුව ජනාධිපතිධූරයේ වැඩ බැලීම පහත පරිදි සිදුවේ.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ කථානායක වරයා ⟶ සෙනෙට් මණ්ඩලයේ තාවකාලික සභාපතිවරයා ⟶ රාජ්‍ය ලේකම් ⟶ කැබිනට් ලේකම් මණ්ඩලයේ අනිකුත් ලේකම්වරු

# අධිකරණය

# අ ධිකරණය

- <u>අධිකරණය හැඳින්වීම.</u>

**ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපනය කළ එකම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණය පමණි.** එය අධිකරණ ධූරාවලියේ අග්‍රස්ථානය ගනී. ඊට පහළින් ඇත්තේ 1891 දී කොංග්‍රස් මණ්ඩලයේ පනතකින් පිහිටුවන ලද සංඝීය පහළ උසාවි වේ.

- <u>අධිකරණයේ ව්‍යූහය.</u>

අධිකරණය ආයතන
- → උසස් අධිකරණ ආයතන / මධ්‍යම ආණ්ඩුවේ අධිකරණය (ශ්‍රේෂ්ඨාධිකරණය)
- → පහළ අධිකරණය / ප්‍රාන්ත ආණ්ඩුවල අධිකරණය

**(ප්‍රාන්ත අභියාචනාධිකරණ - දිසා අධිකරණ - රේගු උසාවි - තීරු බදු ස්වාධිකාර අභියාචනා උසාවි - අයබදු උසාවි - හමුදා අභියාචනා උසාවි)**

- **ශ්‍රේෂ්ඨාධිකරණය**
(සුප්‍රීම් අධිකරණය)

හැඳින්වීම — ඇමරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපනය කර තිබේ. ඇමරිකානු අධිකරණ ධූරාවලියේ ඉහළම අධිකරණය වන්නේ මෙයයි. ලෝකයේ ඇති බලවත් ශ්‍රේෂ්ඨාධිකරණයක් ලෙස ද මෙය හැඳින්විය හැකිය.

සංයුතිය — ශ්‍රේෂ්ඨාධිකරණයේ සංයුතිය සකස්විය යුත්තේ කෙසේ දැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා නැත. මෙහි ප්‍රධානියා **අග්‍රවිනිශ්චකාරවරයා** ය. සාමාන්‍ය තත්වය තුළ **අග්‍රවිනිශ්චකාරවරයා ඇතුළු තවත් විනිසුරුවන් අටදෙනෙක් (1 + 8 = 9)** කින් මෙය සමන්විත වන්නේ ය.

පත් කිරීම — ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චකාරවරු පත් කරනු ලබන්නේ ජනාධිපති වරයා විසිනි. <u>විනිශ්චකාරවරුන් සඳහා පැවතිය යුතු සුදුසුකම් මොනවාදැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවේ</u>. මෙම පත් කිරීම් උත්තර මන්ත්‍රී මණ්ඩලය (සෙනෙට් මණ්ඩලය) අනුමත කළ යුතු ය.

නිල කාලය — **යහපත් කල්ක්‍රියාවෙන් පසුවන තාක් කල් විනිශ්චකාරවරු ධූරදරයි.** තමාට අභිමත විනි නම් අවුරුදු 70 එළඹි පසු විශ්‍රාම යෑමේ හැකියාව පවතී. මෙම තත්ත්වය මත ශ්‍රේෂ්ඨාධිකරණය මහළු විනිශ්චකරුවන්ගෙන් යුක්ත වේ. ඇතැම් විනිශ්චකාරවරු මිය යන තෙක්ම මෙහි රැඳී සිටි. මෙම ආකාරයට **යාවජීව සාමාජිකත්වයක්** ලබාදීම සම්බන්ධයෙන් දැඩි විවේචන ද පවතී.

ඉවත් කිරීම — ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චකාරවරයෙකු ඉවත් කිරීම සඳහා **දෝශාභියෝග චෝදනාවක්** සම්මත විය යුතු ය. එය ආරම්භ කරනු ලබන්නේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයයි. සෙනෙට් මණ්ඩලය 2/3 කින් එම යෝජනවාන සම්මත කළ හොත් විනිශ්චකාරුවන් ඉවත් කළ හැකිය.

■ <u>ශ්‍රේෂ්ඨාධිකරණයේ කාර්ය හා බලතල.</u>

01. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විවරණය කිරීම.**
(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමාලෝචනය කිරීම)

කොංග්‍රස් මණ්ඩලය සකස් කරන නීති - ජනාධිපති විසින් නිකුත් කරන නියෝග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට නොගැලපෙන්නේ නම් ඒවා නිශේධ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති බලය අධිකරණ විවරන බලය නම් වේ.

**(N.B)** *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විවරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට හිමි වීම සම්බන්ධයෙන් විවාදයක් පවතී. ඇතැම් විචාරකයින්ගේ මතය වන්නේ එය ඉතා පැහැදිලිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට ලබා දී ඇති බවයි. ඇතැම් විචාරකයින් එම මතයට එකඟ නැත. පසුව 1803 දී ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලතලයක් ලෙස පිළිගෙන තිබේ.*

02. **මූලික අධිකරණ බලය.**

ඇමරිකාවේ මූලික අධිකරණ බලය හිමි එකම ආයතනය මෙයයි. මධ්‍ය ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතරත්, ප්‍රාන්ත ආණ්ඩු ප්‍රාන්ත ආණ්ඩු අතරත් ඇතිවන ගැටුම් විසඳීම මීට අදාළ වේ.

03. **අභියාචනාධිකරණ බලය.**

අවසාන අභියාචනාධිකරණය වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයයි. ශ්‍රේෂ්ඨාධිකරණයට පහළ අධිකරණ වලින් එන ඕනෑම අභියාචනාවක් විනිශ්චය කිරීමේ හැකියාව තිබේ.

04. **මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය.**

මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාවට නැංවිය යුතු වැදගත් කාර්යකි. මෙම බලය නිසාම ශ්‍රේෂ්ඨාධිකරණයේ ගෞරවය වර්ධනය වී තිබේ.

නිදර්ශන -: <u>1948 සර්ව ආගමික නිදහස පිළිගැනීම.</u>

මධ්‍ය ආණ්ඩුවටත් සංඝීය ආණ්ඩුවටත් දේවස්තානයක් (පල්ලියක්) පිහිටුවිය නොහැකිය. මෙම ආණ්ඩු වර්ග දෙකෙන් එකකටවත් එක් ආගමකට හා සියලුම ආගම් වලට ආධාර කරන හෝ එක් ආගමක් තවත් ආගමකට වඩා කැමැත්තක් දක්වන නීති සම්මත කරගත නොහැකිය.

"බ්‍රවුන්ස්ට එරෙහිව අධ්‍යාපන සභාව " නඩු තීන්දුව.

05. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වර්ධනය කිරීම.**

ඇමරිකානු ව්‍යවස්ථාව වගන්ති **7** කින් පමණක් යුක්ත කෙටි ලියවිල්ලකි. මූල් අවස්ථාවේ ජනපද (13) කින් සමන්විත වූ **ෆිඩෙල්ෆියා සම්මුතිය** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කළේ ය. **එංඩේර කෘෂි ආර්ථිකයක්** සහිත රාජ්‍යයකට සම්පාදනය කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වර්ධනය කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිදු කළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස දැන් ඇමරිකා එක්සත් ජනපදය ජනපද 50 ක් සහිත කාර්මීකරණය අතින් ජගත් බලවතා බවට පත්ව තිබේ.

06. **සංඝීය රාජ්‍යය ක්‍රමය ආරක්ෂා කිරීම.**

ඇමරිකානු සංඝීය ක්‍රමය ආරක්ෂාකොට ගෙන පවත්වාගෙන යාම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විශාල කාර්ය භාරයක් ඉටු කරයි.

**"අධිකරණය සමස්ත සංඝීය පාලන ව්‍යුහයට ස්ථාවරත්වයට පත්කොට ඇති බඳාමය වේ."**

-ෆයිනර්-

- <u>අධිකරණයේ ස්වාධීනත්වය</u>
  (N.B අධිකරණයේ ස්වාධීනත්වය හඳුන්වන්න.)

  අධිකරණයේ ස්වාධීනත්වය සඳහා විධිවිදාන කිහිපයක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා තිබුණි.

  1. බලතල බෙදීමේ සිද්ධාන්තය
  2. සංවරණ තුලන සිද්ධාන්තය
  3. විනිශ්චකාරවරු ජනාධිපති පත් කර ද සෙනෙට් මණ්ඩලය අනුමත කළ යුතු වීම.
  4. දෝශාභියෝග චෝදනාවකින් හැර වෙනත් මාර්ගයකින් විනිසුරුවන් ඉවත් කිරීමට නොහැකි වීම.
  5. වැටුප් ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතු වීම. සේවාකාලය තුළ වැටුප් අඩුකළ නොහැකි වීම.

# කැ බිනට් ක්‍රමය

## කැ බිනට් මණ්ඩලය. (කැබිනට් ලේකම් මණ්ඩලය)

මොකක් ද

ඇමරිකානු කැබිනට් මණ්ඩලය ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ කැබිනට් **ලේකම් මණ්ඩලය** යන නාමයෙනි. ජනාධිපති වරයාගේ **උපදේශක මණ්ඩලය ජනාධිපතිවරයාගේ පවුල** ලෙස ද එය හඳුන්වයි. මෙම කැබිනට් ලේකම් මණ්ඩලය සම්බන්ධ කිසිදු ව්‍යවස්ථාවක් (නීතියක්) ඇමරිකානු ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථාව තුළ දක්වා නොමැත. මෙහි කේන්ද්‍රය (නායකයා) ජනාධිපති වරයාය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා තිබෙන්නේ ජනාධිපතිවරයාට විධායක කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබාගත හැකි බව පමණි. **සම්ප්‍රදායක් ලෙස ජනාධිපතිවරු කැබිනට් ලේකම් මණ්ඩලයක් නිර්මාණය කරගෙන තිබේ**. මෙහි ආරම්භකයා වන්නේ **ජෝර්ජ් වොෂිංටන්** ජනාධිපතිවරයා ය. මෙම කැබිනට් ලේකම් මණ්ඩලය කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් තුළ ක්‍රියාත්මක වන කැබිනට් මණ්ඩලයකට වඩා සෑම ස්වරූපයකින්ම වෙනස් වේ.

සංයුතිය

ජනාධිපතිවරයා ප්‍රමුඛ ලේකම්වරුන්ගෙන් මෙය සමන්විත වෙයි. මොවුන් බොහෝ විට දොපර්තමේන්තු වල ලේකම් වරු වෙයි.

නිදර්ශන -:

| | |
|---|---|
| රාජ්‍ය ලේකම් | භාණ්ඩාගාර ලේකම් |
| ආරක්ෂක ලේකම් | නීතිපති |
| තැපැල්පති | ස්වදේශ කටයුතු ලේකම් |
| කෘෂිකර්ම ලේකම් | වානිජ්‍යය ලේකම් |
| කම්කරු ලේකම් | නිවාස හා නාගරික සංවර්ධන ලේකම් |
| සන්නිවේදන ලේකම් | |

පත් කිරීම

කැබිනට් ලේකම්වරු පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා ය. <u>කොංග්‍රස් මණ්ඩලයේ සාමාජිකයින්ට මෙහි සාමාජිකත්වය ලබානොදේ. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සම්බන්ධයක් ඇති නොකිරීම එහි අරමුණයි.</u> ලේකම්වරු පත්කරන විට පක්ෂයේ අවශ්‍යතා භූගෝලීය කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට ජනපති අමතක නොකරයි. මෙම පත් කිරීම් සෙනෙට් මණ්ඩලය අනුමත කළ යුතු ය. අනුමත නොකළ විට පත් කිරීම් අවලංගු වේ.

**නිදර්ශන -:** **බිල් ක්ලින්ටන්** නීති ලේකම් ලෙස පත්කළ සෝබෙයාට් මහත්මියගේ පත් කිරීම සෙනෙට් මණ්ඩලය අනුමත නොකිරීම. පසුව ඒ සඳහා ජෙනට් රේනෝ පත් කිරීමට ජනාධිපතිට සිදු විය.

නිලකාලය

කැබිනට් ලේකම් මණ්ඩලයේ නිල කාලය වසර 04 කි. ඔවුන්ගේ නිල කාලය ජනාධිපතිවරයාගේ ධූරකාලයට සාමන වේ.

ඉවත් කිරීම

කැබිනට් ලේකම් වරුන් ස්වකීය අභිමතය පරිදි ඉවත් කිරීමට ජනාධිපතිවරයාට හැකිය. ජනාධිපතිගේ කැමැත්ත ඇතිතාක් කල් ධූර දැරීමට කැබිනට් ලේකම් වරුන්ට හැකිය. මේ අනුව බලන කළ <u>කැබිනට් ලේකම්වරු වගකිව යුත්තේ සිය ස්වාමියා වන ජනාධිපතිවරයාට පමණි</u>.

නිදර්ශන -: ජනාධිපති විල්සන් ලේකම් බ්‍රයන් සේවයෙන් ඉවත් කිරීම.
ජනාධිපති ආතර් ලේකම් බ්ලේන් සේවයෙන් ඉවත් කිරීම.

ලක්‍ෂණ

<u>කැබිනට් ලේකම් මණ්ඩලයටම ආවේනික වූ විශේෂ ලක්‍ෂණ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.</u>

- ව්‍යවස්ථාදායක කොංග්‍රස් මණ්ඩලයට පරිබාහිරව කැබිනට් ලේකම් මණ්ඩලය තෝරාගැනීම.
- කොංග්‍රස් මණ්ඩලයේ සාමාජිකයන්ට කැබිනට් ලේකම් මණ්ඩලයේ සාමාජිකත්වය ලබා නොදීම.
- කැබිනට් ලේකම් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට වගකිව යුතු නොවීම.
- කැබිනට් ලේකම් මණ්ඩලය ඉවත් කිරීමට කොංග්‍රසයට නොහැකි වීම.
- ජනාධිපතිගේ උපදේශකයන් මිස සඟයන් නොවීම.
- ජනාධිපතිවරයා උපදෙස් පිළිගැනීමට බැඳී නොසිටීම.
- කැබිනට් ලේකම් මණ්ඩලය ප්‍රතිපත්ති සම්පාදන මණ්ඩලයක් නොවීම.
- කැබිනට් මණ්ඩලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපනය කර නොමැතිවීම. සම්ප්‍රදාය මත නිර්මාණය වීම.
- ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ පවතින අලිඛිත සංකල්පයක් වීම.

■ <u>කැබිනට් මණ්ඩලයේ කාර්ය හා බලතල.</u>

ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ක්‍රියාත්මක වන ඇමරිකාව තුළ පූර්ණ එක් විධායකයක් පවතී. ඒ ජනාධිපතිවරයා ය. ජනාධිපතිවරයාට විධායක කටයුතු සම්බන්ධයෙන් සහාය ලබා ගැනීමට උපදෙස් ලබා ගැනීමට මෙම කැබිනට් ලේකම් මණ්ඩලය පවතී. කැබිනට් ලේකම් මණ්ඩලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැන වූ ආයතනයක් නොවේ. එය සම්ප්‍රදාය මත උත්පාද වූ ආයතනයකි. වෙනත් ලෙසකින් දක්වන්නේ නම් ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ පවතින නිර්ලිඛිත කරුණකට නිදර්ශනයකි.

(i) <u>ජනාධිපතිවරයාට විධායක කාර්යයන් සම්බන්ධයෙන් උපදෙස් දීම.</u>

කැබිනට් ලේකම් මණ්ඩලයේ එකම කාර්ය වන්නේ වත්මන් ජනාධිපතිවරයාට විධායක කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමයත නමුත් එම උපදෙස් පිළිගැනීමට ජනාධිපතිවරයා බැඳී නොමැත.

නිදර්ශන -: **ඒබ්‍රහම් ලින්කන්** ජනාධිපතිවරයා ස්වකීය කැබිනට් ලේකම්වරු 7 දෙනා කැඳවා වැදගත් කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා එම කරුණ සම්බන්ධයෙන් ලේකම්වරුන්ගේ ඡන්දය විමසීය. එහි දී ලේකම්වරු 7 දෙනාම එයට පක්ෂපාතී භාවයක් පලකොට නැත. ඊට පක්ෂ වූයේ ජනාධිපති පමණි. ජනාධිපති ප්‍රකාශ කලේ **"විපක්ෂව ඡන්ද හතකුත් පක්ෂව එක් ඡන්දකුත් පල වී තිබේ. එම නිසා පක්ෂව ඡන්දයදුන් හවතුන්ගේ තීන්දුව සභා සම්මත වේ."** යනුවෙනි.

- <u>**සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය.**</u>

(N.B සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය හඳුන්වන්න.)

ඇමරිකානු කැබිනට් ලේකම් මණ්ඩලය තුළ සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවේ. ඊට හේතුව වන්නේ ඇමරිකාව ජනාධිපති ආණ්ඩුක්‍රමයක් වීමයි. කැබිනට් ලේකම් වරු වගකීමට බැඳී සිටින්නේ ජනාධිපතිවරයාට පමණි.

**"ඇමරිකානු කැබිනට් ලේකම් මණ්ඩලය වගකීමට බැඳී සිටින්නේ සිය ස්වාමියා ජනාධිපති වරයාට පමණි."**

-බ්‍රයිස් සාමි වරයා-

# සංඝීය ක්‍රමය

# සංධීය ක්‍රමය

<u>පොදු හැඳින්වීම.</u>

සංධීය ක්‍රමයක් යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මධ්‍ය හා ප්‍රාන්ථ ආණ්ඩුක්‍රම වලට බලය විමධ්‍යගත කරන ලද ආණ්ඩුක්‍රමයකි. ඒ අනුව බලන කළ ඇමරිකාව සංධීය රාජ්‍යයකි. **1776 දී ඇමරිකානු විප්ලවයෙන් පසු බ්‍රිතාන්‍යයෙන් නිදහස දිනාගත් ඇමරිකානුවන් මුල්** අවස්ථාවේ නිර්මාණය කරනු ලබන්නේ **සංයුක්ත රාජ්‍යයකි**. 1787 දී **ෆිඩෙල්ෆියා සම්මුතිය** මගින් ඇමරිකාව සංධීය රාජ්‍යයක් බවට පත් කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කළේ ය. එය 1789 සිට ක්‍රියාත්මක වේ. මුල් අවස්ථාවේ ජනපද 13 පමණක් පැවති අතර වර්තමානය තුළ ජනපද (ප්‍රාන්ථ) 50 කින් යුක්ත සංධීය රාජ්‍යයක් වේ. **<u>ඇමරිකානු සංධීය ක්‍රමය ලෝකය ප්‍රථම වරට නිර්මාණය වූ සංධීය ක්‍රමය ද වේ. එසේම එය සම්භාව්‍ය සංධීය ක්‍රමයකි</u>.**

ඇමරිකානු ආණ්ඩුක්‍රමය සංධීය ආණ්ඩුක්‍රමයක් ලෙස නිර්මාණය වීමට බලපෑ <u>හේතු සාධක</u> විග්‍රහ කිරීම.

(i) මුල් ජනපද 13 ට නැවතත් බාහිර ආක්‍රමණයක් ඇති වුවහොත් එයට ශක්තිමත්ව මුහුණ දීමට අවශ්‍ය පදනම සකස් කර ගත යුතු යැයි යන මනෝභාවයක් පහළ වීම.

(ii) දේශපාලන සාධකයක්

(iii) භූමිය අතින් විශාල රාජ්‍යයක් වීම.

(iv) ප්‍රාදේශීය ස්වාධීනතාවය සහ ජාතික එක්සත් කම යන අරමුණු ඉටු කර ගැනීමේ අවශ්‍ය තාවය.

ලක්ෂණ

ඇමරිකානු සංධීය ක්‍රමය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගැනීම සඳහා <u>ඇමරිකානු සංධීය ක්‍රමයේ ලක්ෂණ</u> අධ්‍යයනය කළ යුතු ය.

1. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලතල නිශ්චිතව බෙදා තිබීම.**

ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලතල බෙදා තිබේ. ඒ සඳහා <u>බලතල ලැයිස්තු 03 ක් භාවිතා කොට තිබේ</u>.

(i) මධ්‍ය ආණ්ඩුවට භාවිතා කළ හැකි විෂයන් (බලතල)

(ii) මධ්‍ය ආණ්ඩුව භාවිතා කළ නොහැකි විෂයන් (බලතල)

(iii) ප්‍රාන්ත රාජ්‍යයන්ට භාවිතා කළ නොහැකි විෂයන් (බලතල)

● <u>මධ්‍ය ආණ්ඩුවට භාවිතා කළ හැකි විෂයයන් (බලතල)</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මධ්‍ය ආණ්ඩුවට අදාළ විෂයයන් 18 ක් බලතල හිමිකර දී තිබේ. **අයබදු හා තීරු බදු පැනවීම හා රැස් කිරීම - විදේශ වෙළඳාම - ජනපද අතර වාණිජ කටයුතු - විදේශිකයින් රටවැසියන් ලෙස ලියාපදිංචි කිරීම - කිරුම් මිනුම් - පොදු ආරක්ෂක කටයුතු - හමුදා කටයුතු - යුද්ධය හා සාමය - පොදු ශුබසාධනය - මුදල් - විද්‍යාව හා වෙනත් ප්‍රායෝගික කලා ශිල්ප දියුණු කිරීම.**

මෙම විෂයන් සම්බන්ධ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ යන ත්‍රිවිධ ආයතන මධ්‍ය ආණ්ඩුවට තිබේ<u>. ව්‍යවස්ථාදායක කොංග්‍රස් මණ්ඩලය වේ. විධායකය ජනාධිපතිවරයාය. අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණය යි</u>.

● <u>මධ්‍ය ආණ්ඩුවට භාවිතා කළ නොහැකි (තහනම්) විෂයයන්.</u>

**යම් සිද්ධියකට පසු ඊට අදාළ නීති සම්පාදනය කිරීම - ජනතාවගේ ආගමික විශ්වාසයන් කෙරෙහි කුමන ආකාරයකින් හෝ බලපාන නීති සම්මත කිරීම - ප්‍රාන්ත රාජ්‍යයන් පිටරට යවන භාණ්ඩවලට තීරු බදු අය කිරීමට නොහැකි වන නීති - සිරභාරයේ සිටින අයෙක් අධිකරණයට ඉදිරිපත් කිරීමට බාධා වන නීති.** වැනි විෂයයන් සම්බන්ධයෙන් බලතල මධ්‍ය ආණ්ඩුවට නොමැත.

● <u>ප්‍රාන්ත (ජනපද) වලට භාවිතා කළ නොහැකි (තහනම්) විෂයයන්</u>

**ගිවිසුම් වලට එළඹීම - විදේශ සම්බන්ධතා හෝ සංගම්වලට බැඳීම - රාජ අපරාධයක් සම්බන්ධයෙන් පුද්ගලයන්ගේ දේපළ මුදල් අහිමි කරන නීති - ඉතාම හදිසි අවස්ථාවක දී** හැර යුද්ධය සම්බන්ධයෙන් නීති පැනවීමට හෝ ක්‍රියාත්මක වීමට ප්‍රාන්ත රාජ්‍යයන්ට නොහැකි ය.

*මෙම ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළින් මධ්‍ය ආණ්ඩුවට හිමි බලතල ද අහිමි බලතල ද දක්වා තිබේ. නමුත් ප්‍රාන්ත (ජනපද) රාජ්‍යයන්ට අහිමි බලතල පමණක් දක්වා තිබේ. එහි අරමුණ වන්නේ දක්වා නොමැති සියලු බලතල ප්‍රාන්ත රාජ්‍යයන්ට හිමි කර දීමයි. එහි අරමුණ වන්න ශක්තිමත් – ස්වාධීන – ස්වෛරී ප්‍රාන්ත (ජනපද) රාජ්‍යයන් නිර්මාණය කිරීමයි.*

(N.B) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ප්‍රාන්ත රාජ්‍යයන් බලවත් කිරීමට උත්සාහ ගෙන තිබේ. නමුත් ප්‍රායෝගික භාවිතය තුළ ප්‍රාන්ත රාජ්‍යයන් අතික්‍රමණය කරමින් මධ්‍ය ආණ්ඩුව විශාල ලෙස බලවත් වී තිබේ.

■ <u>මධ්‍ය ආණ්ඩුව බලවත් වීමට බල පෑ හේතු</u>

-සංශෝධන බොහෝමයක් මගින් මධ්‍ය ආණ්ඩුවේ බලතල වර්ධනය වීම.
-ශ්‍රේෂ්ඨාධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විවරණය කරන විට ප්‍රාන්ත සතු බලතල වලට හානි පැමිණ වීමෙන් මධ්‍ය ආණ්ඩුව සතු බලතල වර්ධනය වීම.
-අන්තර්ජාතික කටයුතුවල වර්ධනය.
-වානිජ කටයුතු වල වර්ධනය.
-බටහිර බලවේග.

2. **ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබීම.**

ඇමරිකානු සංධීය ක්‍රමය සතු තවත් ලක්ෂණයක් වන්නේ ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීමයි. ලෝක දේශපාලනයේ ප්‍රථම ලිඛිත ව්‍යවස්ථාව මෙය ලෙස හඳුනාගත හැකිය. **වගන්ති 7 ක් සහ සංශෝධන 27 කින්** මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමන්විත වේ.

3. **ව්‍යවස්ථාවේ අනම්‍ය භාවය**

ඇමරිකානු සංධීය ක්‍රමය තුළ ඇති තවත් ලක්ෂණයක් ලෙස අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පෙන්වා දිය හැකිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා **කොංග්‍රස් මණ්ඩලයේ (2/3) ක විශේෂ බහුතරයක් සහ ප්‍රාන්ත රාජ්‍යයන් (3/4) ක් එකඟවිය යුතු ය.**

4. **මධ්‍ය ආණ්ඩුව තුළ ප්‍රාන්ත රාජ්‍යයන්ට නියෝජනයක් ලැබීම.**

මධ්‍ය ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වේ. පළමු සභාව මහජන මන්ත්‍රී මණ්ඩලය වේ. දෙවන සභාව සෙනෙට් මණ්ඩලය වේ. මෙහි සාමජිකයින් 100 කි. ප්‍රාන්තයකින් දෙදෙනා (02) බැගින් ප්‍රාන්ත පනහ (50) ට සමාන නියෝජනයක් ලබාදෙමින් ජනතාව විසින් තෝරාපත් කරයි. **<u>මෙම ආකාරයට ප්‍රාන්ත වලට සමාන නියෝජනයක් ලබාදී සම්භාව්‍ය සංධීය ක්‍රමයක මූලධර්මයකි</u>.**

5. **අධිකරණය බලවත් වීම.**

බලවත් අධිකරණයක් පැවතීම සංධීය ක්‍රමයක ලක්ෂණයකි. ඇමරිකාව තුළ පවතින්නේ ලොව ඇති බලවත් ශ්‍රේෂ්ඨාධිකරණ වලින් එකකි. අධිකරණය බලවත් වීමට බලපෑ හේතු කිහිපයකි.

-මධ්‍ය හා ප්‍රාන්ථ ආණ්ඩු අතර ඇතිවන ගැටුම් විසඳීම.
-ප්‍රාන්ත ආණ්ඩු අතර ඇතිවන ගැටුම් විසඳීම.
-ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම.
-මධ්‍ය ආණ්ඩුව හා පුරවැසියන් අතර ඇති වන ගැටුම් විසඳීම.
-ආණ්ඩක්‍රම ව්‍යවස්ථාව විවරණය කිරීම.

6. **ද්විත්ව පුරවැසි භාවය.**

සම්භාව්‍ය සංධීය ක්‍රමයක ද්විත්ව පුරවැසි භාවය පුරවැසියන්ට හිමි වේ. එනම් තමා ජීවත්වන ප්‍රාන්ථයේ සාමාජිකත්වය මෙන්ම මධ්‍ය ආණ්ඩුවේ සාමාජිකත්වය ද සෑම පුරවැසියකුටම හිමි වේ. ඇමරිකාව ද්විත්ව පුරවැසි භාවය සහිත රාජ්‍යයකි. එම නිසා එය සම්භාව්‍ය සන්ධීය ක්‍රමයක් වේ.

7. **ද්විත්ව පාලන ක්‍රමයක් පැවතීම.**

මධ්‍ය ආණ්ඩුවක් හා ප්‍රාන්ත ආණ්ඩු 50 ඇමරිකාව තුළ පවතී. මධ්‍යම ආණ්ඩුව වෙනම පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කරන අතර ප්‍රාන්ත 50 ද ස්වාධීන ඒකක ලෙස ක්‍රියාත්මක වේ.

8. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතර භාවය.**

ඇමරිකානු රාජ්‍යයේ මූලික නීතිය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීතර වීම සංඝීය ක්‍රමයක අත්‍යවශ්‍ය මූල ධර්මයකි. ඇමරිකාව එම මූලධර්මය සපුරා තිබේ.

9. **සෑම ප්‍රාන්ථයතටම සමාන පිළිගැනීමක් ලබා දීම.**

සෑම ප්‍රාන්තයකටම සමාන තත්වයක් හිමි කර දීම සම්භාව්‍ය සංඝීය ක්‍රමයක ලක්‍ෂණයකි. භූමිය - ජනගහණය - ආර්ථිකය - සම්පත් යන සාධක නොසලකා ඇමරිකාව තුළ සෑම ප්‍රාන්තයක්ම සමාන යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගනෙ තිබේ. සංක්‍ෂිප්තව දක්වන්නේ නම් නෛතික තලය තුළ සියලු ජනපද සමාන තත්ත්වන් භුක්ති විඳී.

# ඊ කෂ ක්‍රමය

## **ප**ක්ෂ ක්‍රමය

● <u>ඇමරිකානු පක්ෂ ක්‍රමයේ **ඉතිහාසය හා විකාශනය.**</u>

ඇමරිකාවේ දේශපාලන පක්ෂ වලට දීර්ඝ ඉතිහාසයක් නොමැත. 1776 ඇමරිකානු විප්ලවයෙන් පසුව දේශපාලන පක්ෂ නිර්මානය වේ. වෙනත් ආකාරයකට දක්වන්නේ නම් බ්‍රිතාන්‍යය අධිරාජ්‍යයවාදයෙන් නිදසහ දිනාගැනීමෙන් පසු ඇමරිකාව තුළ දේශපාලන පක්ෂ උත්පාද වේ.

- o බ්‍රිතාන්‍යයේ නිදහස දිනාගැනීමෙන් පසුව බිහිවූ ප්‍රථම දේශපාලන පක්ෂ දෙක.

**ෆෙඩරල් පක්ෂය** -: මෙහි නායකයා **හැමිල්ටන්ය.** මෙම පක්ෂයේ අදහස වූයේ ශක්තිමත් **මධ්‍ය ආණ්ඩුවක් නිර්මාණය විය යුතු බවයි.**

**සමූහාණ්ඩුවාදී පක්ෂය** -: මෙහි නායකයා **ජෙෆසන්** ය. මෙම පක්ෂයේ අදහස වූ **ප්‍රාන්ථ (ජනපද) බලවත් විය යුතු බවයි.**

- o 1840 ගණන් වන විට දේශපාලන පක්ෂ දෙකක් දක්නට ලැබුණි.

**විග් පක්ෂය**
**ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය**

1860 පමණ විට වහල් මෙහෙය ප්‍රශ්න අනුභූති කොට ගෙන ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් බිහි වී තිබුණි.

**සමූහාණ්ඩාවාදී පක්ෂය** - **Republican**
**ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය** - **Democratic**

මෙම ආකාරයට දේශපාලන පක්ෂ හා පක්ෂ ක්‍රමයක් නිර්මාණය වී තිබේ. නමුත් ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් විශේෂ උනන්දුවකින් සටහන් කළ බවක් පෙනෙන්නට නැත. ඒ සම්බන්ධයෙන් උදාසීන පිළිවෙතක් අනුගමනය කොට තිබේ. ප්‍රථම ජනාධිපති **ජෝර්ජ් වොෂිංටන්** <u>දේශපාලන පක්ෂ බිහිවීම ජාතික සමගියට - ජාතික ඒකාග්‍රතාවයට බාධාවක් බව දක්වමින් දේශපාලන පක්ෂ සමග ඉතා පරිස්සමෙන් කටයුතු කළ යුතු බව ප්‍රකාශ කළේ ය</u>.

● <u>ඇමරිකානු **ද්වි පක්ෂ ක්‍රමය.**</u>

ඇමරිකානු දියාරු ද්විපක්ෂ රටාවක් පවතින රාජ්‍යයකි. වෙනත් රාජ්‍යයක ද්වි පක්ෂ ක්‍රමයක් තුළ දක්නට ඇති තරඟකාරීත්වය - සක්‍රීය භාවය - ගැටුම - බල අරගලය දක්නට නොමැත.

**ද්වි පක්ෂ ක්‍රමය අර්ථ නිරූපණය,**

**"ද්වි පක්ෂ ක්‍රමයක් යනු පක්ෂ දෙකක ආධිපත්‍යය සහිත පක්ෂ ක්‍රමයකි."**

**"ආණ්ඩු බලය දිනාගැනීම සඳහා ශක්තිය සහිත දේශපාලන පක්ෂ දෙකක් පමණක් පැවතීම මින් අර්ථවත් වේ."**

**ඇමරිකාව තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන පක්ෂ දෙක.**

සමූහාණ්ඩාවාදී පක්ෂය - Republic List
ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය - Democratic List

**ඇමරිකාව තුළ ඇති අවශේෂ පක්ෂ.**

රී ෆෝම් - (Re Form party)
හරිත කොමියුනිස්ට්
සමාජවාදී පක්ෂය
සමූපකාර පක්ෂය

මෙම පක්ෂ ආණ්ඩුබලය දිනාගැනීමට තරම් ශක්තියක් නොමැත එම නිසා ඇමරිකානු පක්ෂ ක්‍රමය ද්වි පක්ෂ ක්‍රමයක් ලෙස අර්ථකතනථනය කළ හැකිය.

● ඇමරිකානු පක්ෂ ක්‍රමයේ ලක්ෂණ.

(i) **ද්වි පක්ෂ ක්‍රමයක් වීම.**
(N.B පෙර විස්තර කොට තිබේ)

(ii) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බාහිරව වර්ධනය වීම.**

මහා බ්‍රිතාන්‍යයේ පක්ෂ ක්‍රමය මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ පක්ෂ ක්‍රමය ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පරිබාහිරව වර්ධනය විය. ආමරිකානු ආණ්ඩුක්‍රම සම්පාදකයින් පක්ෂ ක්‍රමය සම්බන්ධයෙන් විරුද්ධ විය. එය ජාතික ඕනෑ එපාකම් වලට අහිතකර වේ යැයි උපකල්පනය කළේ ය. එහෙත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කිරීමට පූර්ව අවධිය තුළ ද පක්ෂ නිර්මණය වී තිබුණි. නගරවල - කෝරළවල - ජනපදවල සංවිධානය වූ ප්‍රාදේශීය කල්ලි ඡන්දදායකයින් ගේ නම යෝජනා කරමින් ජනමතය නිර්මාණය කරමින් සිටියේ ය. පසුව පක්ෂ වලට ව්‍යවස්ථානුකූල පදනමක් ලබා දී තිබුණි.

(iii) **පක්ෂ ප්‍රතිපත්ති වල වෙනසක් නොමැති වීම.**

සමූහාණ්ඩුවාදී පක්ෂයේත් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේත් ප්‍රතිපත්ති එක සමානය. ආර්ථික ප්‍රතිපත්තිය ධනවාදී විවෘත්ත ආර්ථික ප්‍රතිපත්තිය ද දේශපාලන ප්‍රතිපත්තිය ලිබරල්වාදී ද විදේශ ප්‍රතිපත්තිය තුළ ඇමරිකාව ලෝක බලවතා කිරීමේ ආධ්‍යාශය පක්ෂ දෙකටම තිබේ.

(iv) **නිදහස් වාදය.**

ඇමරිකානු පක්ෂ ක්‍රමය තුළ නිදහස් වාදී ලක්ෂණයකැයි පෙනෙන ලක්ෂණයකි. **නිදහස්වාදය යනු පක්ෂ නීති උල්ලංඝනය කිරීමට - පක්ෂ නායකයන්ට අවනත නොවී සිටීමට -පක්ෂ ප්‍රතිපත්ති වලට අවනත නොවී සිටීමට - පක්ෂ සාමාජිකයින්ට ඇති හැකියාවයි.** එසේ කිරීම හේතු කොටගෙන සාමාජිකයින් පක්ෂයෙන් ඉවත් නොකරයි.

**නිදර්ශන -:** කොංග්‍රස් මණ්ඩලයේ දී **හරස් ඡන්දය** ප්‍රකාශ කිරීම. එනම් ඉන් ප්‍රකාශ වනුයේ සමූහාණ්ඩවාදී පක්ෂය මන්ත්‍රීවරු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඡන්දය දීමත් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මන්ත්‍රීවරු සමූහාණ්ඩුවාදී පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඡන්දය දීමත් ය. පක්ෂ තුළ ඇති නිදහස් භාවය මෙම ඡන්දක්‍රම මතින් මනාව ගම්‍ය වේ.

(v) **ආගම - වර්ගය - කුලය වැනි ප්‍රාථමික සාධක මත පක්ෂ සංවිධාන ගත වී නොමැති බව.**

ඇමරිකාව තුළ පක්ෂ සංවිධාන ගතව ඇත්තේ උක්ත ප්‍රාථමික මූලධර්ම මත නොවේ. එම නිසා පක්ෂ ප්‍රතිපත්ති අතර සහ පක්ෂ අතර දැඩි සාම්‍ය තාවක් පවතී.

(vi) **පක්ෂවලට ස්ථිර නායකයන් නොමැති වීම.**

(vii) **ප්‍රදේශ බද්ධ ව්‍යාප්තිය.**